The Journal of Archaeology and Heritage Studies (JAHS) 2024: 11 (II) 98-114 pp.

The Journal of
ARCHAEOLOGY & HERITAGE STUDIES

Journal Home page http://fssh.rjt.ac.lk/index.php/jahs/

Research Paper

# Information revealed by literary sources about the use of bows in Ancient Sri Lanka

**S.W. Supun Gayan Wijerathna**

Temporary Lecturer, Department of History, Faculty of Arts, University of Peradeniya. gayand02i83@gmail.com

## ABSTRACT

Investigation to Ancient Sri Lankan History, we can see there have been various threats both domestically and global, and security organization methods have also come forward for the security of the state. The weapons used in these defense organizations and fighting activities had a very important place, and a number of factors that the bow was a main weapon in the tasks can be identified from the literary and archaeological sources. This research problem is, What is the information does the literary source reveal about the bow among the weapons used in ancient Sri Lanka? Accordingly, the purposes of this research is to briefly examine the weapons used in the security organizations of Sri Lanka in the past and to examine various aspects of the bow based on the facts revealed by literary sources. The non-field method was used this research and according to the qualitative research method, used library and collect data by primary and secondary sources, analyze the data and drawn conclusions. Examining the defense organization and fighting methods of ancient Sri Lanka, numerous facts are found regarding the weapons used, and it is seen that the bow was a prominent weapon among those weapons. A number of bows of different types can be identified, used by warriors of various levels, from the king to the common soldier. It can be clearly identified that the bow was used in mainly war activities and another day-today activities.

ARTICLE INFO

***Article history:***
Article Received: 20 September 2024
Revision Received: 28 February 2025
Accepted: 01 June 2025
Available online: 18 July 2025

***Keywords:*** *Ancient Sri Lanka, Arrow, bow, Security organization, Weapons*

# පුරාතන ශ්‍රී ලංකාවේ දුනු භාවිතය පිළිබඳ සාහිත්‍යමය මූලාශ්‍රය ඇසුරෙන් හෙළිවන තොරතුරු

## 1. හැඳින්වීම

පුරාතන අවධියේ සිට නූතනය දක්වාම ලොව බොහෝ සමාජවල පවතින සනාතනික තත්ත්වයක් ලෙස යුද්ධය හඳුනාගත හැකිය. බොහෝ විට යුද්ධයට හේතු වන්නේ මතවාදී ගැටුමක් වන අතර එහි ප්‍රතිඵල බෙහෙවින්



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

භයානක වේ. පුරාතනයේ සිට සමාජ කණ්ඩායම් අතර විවිධ හේතු පදනම්ව යුද්ධ ඇති වී තිබෙන අතර යුද්ධයෙන් අධිරාජ්‍යයන් පවා බිහිකරගත් අවස්ථා දක්නට ලැබේ. මානව ඉතිහාසයේ වැදගත් අවස්ථාවක් වූ මෙකී යුද්ධයන්හි දී සතුරන් අඩපණ කිරීමට මෙන්ම සතුරන් මැඩපැවැත්වීම සඳහා විවිධ ආයුධ භාවිතයට ගෙන තිබෙන ආකාරය පැහැදිලිව හඳුනාගත හැකිය. සතුරන්ගේ ආයුධයන්ට වඩා තම ආයුධ දියුණු තත්ත්වයක පවත්වා ගැනීමට සෑම ප්‍රතිරෝධී කණ්ඩායමක්ම උත්සාහ ගෙන ඇත. ලොව පැරණිතම සමාජයන්හි දේවත්වය ප්‍රමුඛ තත්ත්වයක සලකන අවස්ථාවන්හි දී දෙවියන් අතර ඇතිවන යුද්ධයන් විස්තර කිරීමේ දී විවිධ ආයුධයන් භාවිත කිරීම පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍රය ඇසුරින් තොරතුරු ඉදිරිපත් වේ. පෙරදිග මෙන්ම බටහිර සමාජයන්හි දෙවියන් විසින් භාවිත කළ බව විශ්වාස කරන බලවත් ආයුධ පිළිබඳ මෙලෙස අදහස් ඉදිරිපත් වීම නිසා ද යුද්ධයන්හි දී ආයුධයන්ට ඉතාමත් වැදගත් තත්ත්වයක් හිමි වූ බව හඳුනාගත හැකිය.

යුද්ධ කාර්යයන් විමසන විට ද්වන්ද සටන් පිළිබඳ පැහැදිලි තොරතුරු හමුවන අතර මෙහි දී කාය ශක්තිය හා ශිල්පීය දක්ෂතාවය උරගා බලන ලදී. පෙරදිග සමාජයන් විමසන විට රජුන්ට මූලික වශයෙන් ඇත්, අස්, රිය, පාබල වශයෙන් චතුරංගනී සේනාවක් විය. මෙකී සේනාවන්ගේ දක්ෂතාවය හා සංඛ්‍යාව විශාල වීම යුද්ධයන්ගේ ජයග්‍රහණයට ප්‍රබලව හේතු විය. රජ කුමාරවරුන් විවිධ ශිල්පයන් ප්‍රගුණ කළ අතර එහි දී යුධ ශිල්පය ද ප්‍රමුඛ අවස්ථාවක් විය. ඉන්දියාව මෙන්ම ශ්‍රී ලංකාව දෙස අවධානය යොමු කරන විට රජ කුමාරවරුන් යුධ ශිල්පය ප්‍රගුණ කළ බවට සාධක විශාල ප්‍රමාණයක් ඉදිරිපත් වේ. මේ ආකාරයට පැරණි රණශූරයන් යුද්ධ කාර්යයන්හි දී භාවිත කළ යුධ අවි ආයුධ වර්ග රාශියක් වන අතර එහි දී පංචායුධ ප්‍රමුඛතම අවස්ථාවක් වේ. මහාවංසයේ පංචායුධ (මහාවංසය, 2018: පරි. 40, 48 ගාථාව) මෙන්ම දසාඩායුධ (මහාවංසය, 2018: පරි. 70, 230 ගාථාව) පිළිබඳ විවිධ අවස්ථාවල දී සඳහන් වේ. නමුත් මෙම පංචායුධ යනු චතුරංගනී සේනාව මෙන් හුදු සම්ප්‍රදායාත්මක නාමයක් වන අතර වංසකතාකරු සැබෑ තත්ත්වය නොසළකා මෙම වචනය භාවිත කර ඇති බව විල්හෙල්ම් ගයිගර් පවසයි (ගයිගර්, 1969: 228 පි.). කෙසේ වුවද සත්ත්වයන්ගේ දිවි සසල කරනු පිණිස හේතුවන නිසා "ආවුධ" යැයි පවසන බව වංසත්තප්පකාසිනියෙහි දක්වයි (වංසත්තප්පකාසිනී, 1994: 190 පි.). පොළොන්නරු යුගයේ රචිත බවට සැලකෙන අභිධානප්පදීපිකාවට අනුව සිංහල අවි ආයුධ ප්‍රධාන වශයෙන් කොටස් 4 කට වර්ග කෙරේ.

"මුත්තා මුත්ත මමුත්තඤ්ච
පාණිතො මුත්තමෙවච
යන්ත මුත්තනති සකල
මායුධං තං චතුබ්බිධං"

(අභිධානප්පදීපිකා නම් පාලිනිඝණ්ඩුව, 1960: 375 පද්‍යය)

වශයෙන් සඳහන් වන අතර එහි අර්ථය විමසන විට,

- මුත්තාමුත්ත - දමා ගැසීමෙන් හෝ අතේ තබාගෙන පහර දිය හැකි ආයුධ
- අමුත්ත - අතේ තබාගෙන පමණක් පහරදිය හැකි ආයුධ
- පාණිමුත්ත - අතින් මුදාහරින ආයුධ
- යන්තමුත්ත - උපකරණයක් මගින් මුදාහරින ආයුධ

වශයෙන් හඳුනාගත හැකිය. එමෙන්ම ප්‍රහාරයක දුර අනුව පැරණි ආයුධ කොටස් 3 කට බෙදිය හැකිය.

- කෙටි දුර ප්‍රහාරක ආයුධ - කඩුව, මුගුර, කෙටේරිය, සිරිය, යගදාව
- මධ්‍යම ප්‍රහාරක ආයුධ - චන්ද්‍රවංකය, පාරාවළල්ල, චක්‍රය
- දිගු දුර ප්‍රහාරක ආයුධ - දුන්න, ගප්ටිය, ගල්දුන්න

වශයෙනි. අතීත ශ්‍රී ලාංකිකයන් භාවිත කළ ප්‍රමුඛතම අවි ආයුධ 32 ක් පිළිබඳ පී. ඊ. පී. දැරණියගල සහ තෙන්නකෝන් විමලානන්ද විසින් තොරතුරු ඉදිරිපත් කර තිබේ. තෙබ, තලිකොලේ, ඉෂ්ටි, කොන්තේ, ත්‍රිශූලය, ශේලායුධය. නරච්චියේ, වජ්‍රමුෂ්ටි, තෝමරය, කෙටේරිය, යගදාව, පාරා වළල්ල, චක්‍රය, සිරිය, කන්ඩි තලය, කරවල, කඩුව, කැති ආයුදේ, චන්දප්ප්‍රඋර්ටිය, ඥානවලය, ඊ දඬු, හෙණ්ඩු වලේ, මහත් ඉතලේ, මුගුර,


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

යමුගුර, සුරිග, සොර කොල්ල ආයුදේ, නලිනොල, දැමුණ කොල ආයුදේ, සවලය, අඩයටි වශයෙනි (Deraniyagala, 1942: p.101; විමලානන්ද, 1962: 422 පි.). එම ආයුධවලින් කඩුව, දුන්න, මුගුර, සිරිය සහ හෙල්ලය වැදගත්ම ආයුධ ලෙසට තෙන්නකෝන් විමලානන්ද දක්වා තිබේ (විමලානන්ද, 1962: 421 පි.). දඹදෙණි අස්න සහ කඳවුරු සිරිත මූලාශ්‍රයන්හි අවි ආයුධ රාශියක් පිළිබඳ සඳහන් වේ. ඒ අතර කඩු 28 ක්, දුනු 21 ක්, මුගුරු 12 ක් හා වෙනත් ආයුධ 16 ක් ප්‍රධාන වෙයි. කඩුව, හෙල්ල, දුන්න සටන් සඳහා හා ආරක්ෂාව සඳහා නිතර සිංහලයන් විසින් භාවිත කරන ලදී (ආනන්ද හිමි, 1997: 99 පි.).

මේ ආකාරයට යුද්ධයන්හි දී භාවිත වූ විවිධ ආයුධ අතර දුර සිට පහරදිය හැකි ආයුධයක් වූ දුන්න මූලිකම අවස්ථාවක් විය. පුරාතන ශ්‍රී ලංකාවේ භාවිත වූ අවි ආයුධ අතර දුන්න පිළිබඳ සාහිත්‍යමය මූලාශ්‍රය ඇසුරින් හෙළිවන තොරතුරු මොනවාද? යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ. මෙම පර්යේෂණයේ දී අතීත ශ්‍රී ලංකාවේ ආරක්ෂක සංවිධාන කටයුතුවල දී භාවිත වූ අවි ආයුධ පිළිබඳ විමසා බැලීම ද, සාහිත්‍යමය මූලාශ්‍රයවලින් හෙළිවන තොරතුරු ඇසුරින් දුන්න පිළිබඳ විවිධ පැතිකඩ ඔස්සේ විමසා බැලීම ද අරමුණු වෙයි.

පුරාතන ශ්‍රී ලංකාවේ අවි ආයුධ පිළිබඳ විවිධ පර්යේෂකයන් විසින් අධ්‍යයන කීපයක් සිදු කර ඇත. පී. ඊ. පී. දැරණියගල විසින් 1942 වසරේදී Journal of the Ceylon Branch of the Royal Asiatic Society of Great Britain & Ireland, Vol.35, No 95 සඟරාවට යොමු කරන ලද "Sinhala Weapons and Armor" නම් ලිපිය මගින් පුරාතන සිංහලයන්ගේ ආයුධ සහ සන්නාහ ක්‍රම පිළිබඳ සාකච්ඡා කර තිබේ. මෙහි දී පුරාතන හා පසුකාලීන ශ්‍රී ලංකාවේ භාවිත වූ විවිධ ආයුධ වර්ග මෙන්ම ආයුධ නිර්මාණය වැනි විවිධ අංශ පිළිබඳ සාකච්ඡා කර තිබේ. පුරාතන සිංහලයන් භාවිත කළ ප්‍රධාන ආයුධ ලෙස කඩුව, දුන්න, හෙල්ල, චක්‍රායුධය, තුවක්කුව, පලිහ, මුගුර, බූමරංගය, කෙටේරිය ආදියේ නිර්මාණ ශිල්පය, භාවිතය වැනි අංශ පිළිබඳ සංක්ෂිප්තව සාකච්ඡා කර තිබේ. තෙන්නකෝන් විමලානන්ද විසින් 1962 වසරේ දී ප්‍රකාශයට පත්කළ උඩරට මහ කැරැල්ල දෙවෙනි කාණ්ඩය කෘතියේ දී සිංහල ආයුධ සහ සන්නාහ පිළිබඳ සාකච්ඡා කර තිබේ. මෙහි දී පුරාතන ශ්‍රී ලංකාවේ භාවිත වූ විවිධ ආයුධ වර්ග, ආයුධ නිර්මාණය, ආයුධ නිර්මාණය හා සම්බන්ධව පැවති විශ්වාසයන්, මිනුම් ක්‍රමයන් හා ආයුධ භාවිතය පිළිබඳ සාකච්ඡා කර ඇති ආකාරය දක්නට ලැබේ. ඈම්. බී. ආරියපාල විසින් 1962 වසරේ දී ප්‍රකාශයට පත්කළ මධ්‍යකාලීන ලංකා සමාජය නැමැති කෘතිය මගින් මධ්‍යකාලීන අවධියේ ශ්‍රී ලංකාවේ යුද්ධ සංවිධානය පිළිබඳ විමසීමට ලක්කර තිබෙන අතර එහි දී විවිධ ආයුධ පිළිබඳ සංක්ෂිප්ත වශයෙන් අවධානය යොමුකර ඇති බව දක්නට ලැබේ. හේම එල්ලාවල විසින් 1962 වසරේ දී ප්‍රකාශයට පත්කළ පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය කෘතිය තුළ යුධ සේවාවන් පිළිබඳ සාකච්ඡා කිරීමේ දී විවිධ ආයුධ ශිල්පයන් හා භාවිතයන් පිළිබඳ ඉතා සංක්ෂිප්ත වශයෙන් සාකච්ඡා කර තිබේ. විල්හෙල්ම් ගයිගර් විසින් 1969 වසරේ දී ප්‍රකාශයට පත් කරන ලද මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය කෘතිය තුළින් ද මධ්‍යකාලීන අවධියේ ශ්‍රී ලංකාවේ භාවිත වූ අවි ආයුධ පිළිබඳ සංක්ෂිප්ත වශයෙන් අවධානය යොමු වී තිබේ. ටී. ජී. කුලතුංග විසින් 1988 වසරේ දී ප්‍රකාශයට පත්කළ මධ්‍යකාලීන ශ්‍රී ලංකාවේ ආරක්ෂක සංවිධාන (ක්‍රි. ව. 1 සිට 12 වැනි සියවස අග දක්වා) කෘතියේ දී මධ්‍යකාලීන අවධියේ භාවිත කළ අවි ආයුධ පිළිබඳ විමසා තිබේ. මෙහි දී කඩුව, දුන්න, අඩයටි හෙවත් හෙල්ල, ජුරිකා හෙවත් සිරිය වැනි ආයුධ පිළිබඳ අවධානය යොමුකර තිබේ. ජී. ඇස්. ගමගේ විසින් 1997 වසරේ දී ප්‍රකාශයට පත්කළ මහනුවර යුගයේ රාජ්‍ය ආරක්ෂක ක්‍රමෝපාය නැමැති කෘතිය මගින් රාජ්‍ය ආරක්ෂක විධි යටතේ අවි ආයුධ සහ සන්නාහ ක්‍රම පිළිබඳ විමසීමට ලක්කර තිබෙන අතර එහි දී දුනු ශිල්පය, කඩු ශිල්පය, හෙල්ල, තෝමරය, කෙටේරිය, පොරොව, මුගුර, සිරිය, මන්නය, තුවක්කුව, පාරා වළල්ල, චක්‍රායුධ වැනි ආයුධ භාවිතයන් හා ඒ පිළිබඳ විවිධ මූලාශ්‍ර ඇසුරින් හෙළිවන තොරතුරු පිළිබද විවිධ පැතිකඩයන් ඔස්සේ සැකෙවින් විමර්ශනය කර තිබේ. මෙම අධ්‍යයනයන් මගින් පුරාතන ශ්‍රී ලංකාවේ භාවිත අවි ආයුධ පිළිබඳ විවිධ අංශ ඔස්සේ විමසා ඇති අතර දුනු භාවිතය පිළිබඳ යම් යම් තොරතුරු ඉදිරිපත් වුවද සාහිත්‍යමය මූලාශ්‍රය ආශ්‍රයෙන් ඉදිරිපත් වන තොරතුරු ඇසුරින් සවිස්තරාත්මක විග්‍රයක් සිදු වී ඇති ආකාරයක් දක්නට නොලැබේ. මේ නිසා ප්‍රාථමික මූලාශ්‍රය කෙරෙහි විශේෂ


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

අවධානයක් යොමු කරමින් පුරාතන ශ්‍රී ලංකාවේ දුනු භාවිතය පිළිබඳ තවදුරටත් සියුම්ව විමර්ශනය කිරීමට මෙහි දී ක්‍රියාකරනු ලැබේ.

## 2. ක්‍රමවේදය

මෙහි දී අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් පුස්තකාල අධ්‍යයන ක්‍රමවේදය භාවිතා කෙරිණි. ඒ අනුව පුස්තකාල අධ්‍යයනය ඔස්සේ සාහිත්‍ය විමර්ශනයට අදාළ තොරතුරු රැස් කරන ලදී. අනතුරුව දුනු භාවිතය පිළිබඳ සිදුකර ඇති පූර්ව පර්යේෂණ අධ්‍යයනය කරන ලද අතර එවායේ අඩුපාඩු ද හඳුනාගනිමින් ප්‍රාථමික හා ද්විතියීක මූලාශ්‍රය පරිශීලනය කරමින් දත්ත රැස්කර, එම දත්ත විශ්ලේෂණය ඔස්සේ සාකච්ඡාව සිදුකොට නිගමනවලට එළඹීම සිදු කරන ලදී.

## 3. ප්‍රතිඵල

අතීත ශ්‍රී ලංකාවේ ආරක්ෂක සංවිධානය පිළිබඳ අවධානය යොමු කරන විට භාවිත කරනු ලැබූ අවි ආයුධ රාශියක් හඳුනාගත හැකි අතර දුන්න ප්‍රමුඛතම ආයුධයක් වේ. පුරාතන ශ්‍රී ලාංකිකයන්ගේ දුනු භාවිතය පිළිබඳ සාහිත්‍යමය මූලාශ්‍ර ඇසුරින් හෙළිවන තොරතුරු විමසන විට නිර්මාණ විධිය, නිර්මාණය සඳහා යොදා ගන්නා ලද අමු ද්‍රව්‍ය, හැඩය හා භාවිතා කරන ආකාරය මත දුනු වර්ග ගණනාවක් පැවති බව දක්නට ලැබේ. දුනු නිර්මාණයේ දී විවිධ ශිල්ප ක්‍රමයන් භාවිත කළ අතර සාමාන්‍යයෙන් නැමී සිටින ආකාරයෙන් අඩ සඳක හැඩයෙන් යුතුව නිර්මාණය කළ බව දැකිය හැකිය. භාවිතා කරන්නාගේ ශක්ති ප්‍රමාණයට අනුව එය නිර්මාණය කරන ලද අතර විවිධ මිනුම් ක්‍රම පැවති බව ද හඳුනාගත හැකිය. දුන්න හා සම්බන්ධ අනෙක් වැදගත්ම අංගය හීය වූ අතර එය නිර්මාණයේදී ද සැළකිලිමත් වී ඇති බව හඳුනාගත හැකිය. දුනු ශිල්පය විවිධ අංගයන්ගෙන් යුක්තව ක්‍රියාත්මක වී තිබෙන අතර රාජකීයයන්, රණශූරයන් මෙන්ම සාමාන්‍ය ජනයා ද දුනු භාවිත කළ බවට සාදක හමු වේ. රාජකීයයන්ගේ අධ්‍යාපනයේ මූලිකම අවස්ථාවක් ලෙසද දුනු ශිල්පය හඳුනාගත හැකි අතර දුනු ශිල්පයෙහි පරතෙරට පැමිණියා වූ විවිධ දක්ෂතා හා හැකියාවන්ගෙන් යුක්ත වූ ධනුර්ධරයන් සිටි බවද ඇතැම් අවස්ථාවලදී ඔවුන්ගේ දක්ෂතා ඇගයීම සිදු වූ බවද සාහිත්‍ය මූලාශ්‍රගත තොරතුරු මත පදනම්ව හඳුනාගත හැකිය. සාහිත්‍ය මූලාශ්‍රය ඉදිරිපත් කරන දුනු භාවිතයේ ඇතැම් තොරතුරු ඒ ආකාරයෙන්ම පිළිගත නොහැකි නමුත් එකී තොරතුරු ඇසුරින් සමකාලීන අවධීන්හි දුනු භාවිතය හා ඒ පිළිබඳ පැවති සමාජ ආකල්ප, විශ්වාස සම්බන්ධයෙන් මනා අවබෝධයක් ලබාගත හැකි වේ.

## 4. සාකච්ඡාව

පුරාතන ශ්‍රී ලංකාව පිළිබඳ විමසන විට ලාංකිකයන් උපායශීලී ආරක්ෂක සංවිධානයන් මෙන්ම දියුණු අවි ආයුධ සහ සන්නාහ ක්‍රම භාවිත කළ බවට සාධක සාහිත්‍ය මූලාශ්‍රයවලින් මෙන්ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයවලින් හඳුනාගත හැකි වේ. පුරාතන ලෝකයේ සමාජයන් විමසන විට යුද්ධය මෙන්ම යුද්ධය සඳහා භාවිත කළ උපක්‍රම හා අවි ආයුධ විවිධ වූ බව පැහැදිලිව හඳුනාගත හැකිය. පුරාතන ඉන්දීය දේශපාලන න්‍යායන් පිළිබඳ අවධානය යොමු කරන විට රාජ්‍යයන් අතර ඇතිවන විවිධ මතභේද හා ගැටීම්වල අවසාන ප්‍රතිඵලය යුද්ධය බව ප්‍රකාශ කරන අතර රාජ්‍යයක ආරක්ෂාව, අභිවර්ධනය හා පුද්ගලයන් වශයෙන් කීර්තිය වර්ධනය කර ගැනීම සඳහා රජුන් තුළ පවතින අභිලාෂ වැනි හේතූන් නිසා යුද්ධය රාජ්‍ය පාලනයේ එක් අත්‍යවශ්‍ය අංගයක් ලෙස දුටු බවක් ඉස්මතු වේ. නමුත් යුද්ධයන්හි ආදීනව දුටු ඇතැම් න්‍යායාචාරීන් එමගින් සිදුවිය හැකි මනුෂ්‍ය ජීවිත හා දේපළ හානි අවම කර ගැනීමේ උපක්‍රම කෙරෙහි අවධානය යොමුකළ බව හඳුනාගත හැකිය. මනුස්මෘතිය, කාමණ්ඩකීය නීතිසාරය වැනි කෘතීන් හා බෞද්ධ හා ජෛන වැනි දර්ශනයන් මගින් යුද්ධයෙහි ආදීනව පිළිබඳ සාකච්ඡා කොට තිබේ (ඉලංගසිංහ, 2002: 59-61 පි.). යුද්ධ විද්‍යාව පිළිබඳ කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයේ දී දීර්ඝ ලෙස සාකච්ඡා කර තිබේ (කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රය, 2003: අධ්‍යාය 4, 5, 7, 8).

අභිධාප්පදීපිකාවෙහි දුන්න හැඳින්වූ නාමයන් 5 ක් පිළිබඳ සඳහන් වේ.

> "ඉස්සාසං; ධනු; කොදණ්ඩං;
>
> චාපො; (නිත්ථී) සරාසනං;"

(අභිධානප්පදීපිකා නම් පාලිනිඝණ්ඩුව, 1960: 377 පද්‍යය)



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

ඒ අනුව "ඉස්සාසං", "ධනු", "කොදණ්ඩං", " චාපො", " සරාසනං" යන නාමයන් ද දුන්න සඳහා භාවිත කළ බව හඳුනාගත හැකිය. දුන්න හා සම්බන්ධ ඉතාම වැදගත් අනෙක් අංගයන් වන දුනුදිය "ගුණෝ", "ජියා", "ජ්‍යා" ලෙස හඳුන්වා තිබේ (අභිධානප්පදීපිකා නම් පාලිනිඝණ්ඩුව, 1960: 377 පද්‍යය).

### 4.1. දුනු වර්ග

දුන්නෙහි හැඩය, නිර්මාණය කරන ලද ද්‍රව්‍ය, භාවිත කරන ආකාරය වැනි අවස්ථා මත පදනම්ව දුනු වර්ග ගණනාවක් හඳුනාගත හැකිය. දෙවන පරාක්‍රමබාහු රජු කාලිංග මාඝ සමඟ යුද්ධයට යෑමේ දී ඔහුගේ සේනාවන් රැගෙන ගිය අවි ආයුධ අතර දුනු වර්ග 21 ක් පිළිබඳ දඹදෙණි අස්න සඳහන් කරයි. එනම් යොන් දුනු, තන්තාරි දුනු, ගල් දුනු, මට්ටම් දුනු, රන් දුනු, රිදී දුනු, රුවන් දුනු, මාර දුනු, මාරපංගම් දුනු, මාලක්කම් දුනු, ඕලක්කම් දුනු, කලු දුනු, කලුවැල්ල දුනු, නඩහඹු දුනු, මැඩග දුනු, මිටි දුනු, උස් දුනු, චන්ද්‍රවංක දුනු, සූර්‍යවංක දුනු, ත්‍රිවංක දුනු, සින්දුරන් දුනු වශයෙනි (දඹදෙණි අස්න, 1928: 6 පි.).

දඹදෙණි අස්නෙහි දැක්වෙන දුනු වර්ග විස්තර කරමින් සංස්කාරකවරුන් පෙන්වාදෙන ආකාරයට "උස්දුනු" නම් සාමාන්‍ය දුන්නට වඩා දිගින් වැඩි දුන්න වන අතර එහි දුනුදිය ලිහිල්ය. එයට භාවිත කරන හී ද දිගින් වැඩි අතර එය භාවිත කරන්නාගේ උසට වඩා වියත් තුනක් දිග ඇත. "මිටි දුනු" නම් උස් දුනුවලට වඩා ප්‍රමාණයෙන් කෙටි දුනුය. එහි දුනුදිය තද ගතියකින් යුක්ත වන අතර ශක්තිමත්ය. හීය ද කෙටිය. "ඕලක්කම් දුනු" නම් අනෙක් දුනුවලට වඩා දර්ශනීය හා අලංකාරවත් ලෙස සකස් කරන ලද ඒවාය. එම දුනු රජු විසින් විශේෂ ප්‍රදර්ශන අවස්ථාවලදී භාවිත කරන ලදී. " කලුවැල් දුනු" යනු කළුවර ලීයෙන් හෝ කළුවැල් නම් ලී වර්ගයෙන් හෝ නිර්මාණය කරන ලද දුන්නයි. කලුවැල අවශ්‍ය ලෙසින් නමා සකස් කරගත හැකි ශක්තිමත් වැලකි. "ගල් දුනු" නම් ගල් විදින දුන්නයි. එහි දුනුදිය 2 ක් වන අතර මැද කුඩාවට වියන ලද කොටසක් ඇත. එය අනෙක් දුනුවලට වඩා විශේෂ දුන්නකි. "චන්ද්‍රවංක දුනු" යනු අඩසඳ මෙන් වක් වූ දුනුය. වීණාවක මෙන් සිහින් ශබ්දයක් නගාගෙන හී විදිය හැකි දුනු "තන්තාරි දුනු" නම් වේ. "ත්‍රිවංක දුනු" යනු වක් 3 ක් සහිත දුනුය. "නඩහඹු දුනු" නම් නච්චම්බු දුනුය. නච්චම්බු යනු මැලේසියානු විෂ වර්ගයකි. එම නච්චම්බු විෂ වර්ගයේ පොවන ලද විදිනු ලබන දුන්න නච්චම්බු දුනු නම් වේ. එළුවාගේ අඟක ආකාරයෙන් සකස් කරන ලද මිටක් සහිත දුන්න " මැඩග දුනු" විය. "මට්ටම් දුන්නෙහි" මිට ඍජු ලීයක් වශයෙන් තනා එහි දුනුදිය ඔතා තබනු ලැබේ. අවශ්‍ය වූ විට දුනුදිය මිටේ දෙකෙළවර ගැට ගැසීමෙන් සකස් කෙරේ. "මාරපංගම් දුනු" නම් තිත්ත වැල්වලින් තනා ගන්නා දුනුය. බොහෝ අවස්ථාවලදී දුනුවලට නම් යොදා ඇත්තේ දුනුදිය අනුව නොව දුනුමිට අනුව නිසා මාරපංගම් දුනුවල ද දුනුමිට මාරපංගම් නමැති වැල් වර්ගයකින් තනා ගන්නට ඇත. "මාරදුනු" යනු මාර වැනි ලී වර්ගයකින් තතන ලද හෝ මරණය ගෙන දෙන හී විදිය හැකි දුනුය. "මිටි දුනු" කුඩා වන අතර ශක්තියෙන් වැඩිය. බලවත් පුරුෂයන් විසින් පමණක් භාවිත කළ හැකි මිටි දුනුවලින් විදින හීය ද වේගවත්ය. "යොන් දුනු" යනු අරාබි දේශයෙන් හෝ ග්‍රීසියෙන් ගෙන්වන ලද දුනුය. සටන්වලින් ජයග්‍රහණය කළ පසු රජු විසින් සෙන්පතියන්ට ගෞරව නාම සහිතව රන් දුනු, රිදී දුනු පරිත්‍යාග කළ බව හඳුනාගත හැකිය. රන්විලි ගැසූ දුනු, රිදීවිලි ගැසූ දුනු ද විශේෂයෙන් උසස් නිලධාරීහු භාවිත කළහ. දුන්නට විලි යෙදීම අලංකාරය සඳහා සිදු කරන කටයුත්තකි. එසේම රිදීයෙන් හෝ රනින් විලි යෙදීමෙන් දුන්නේ වටිනාකම වැඩිවේ. බෙරවලටත්, රන් රිදී විලි යොදා උඩරැටියෝ භාවිත කරති. "රුවන් දුනු" නම් සත් රුවනින් සරසන ලද දුන්නයි. "මාලක්කම්" දුනු යනු චම්පු හෝ කොහොඹ ලීයෙන් තනාගත් දුන්නයි. කොහොඹ ලීය ශක්තිමත්ය. "සින්දුර දුනු" නම් රතු ඊයම් හෝ සාදිලිංගම් හෝ යොදා සකස් කරන ලද දුන්නකි. සින්දුර නමින් පැළෑටි වර්ගයක් තිබෙන අතර එම පැළෑටිවල ලීවලින් සාදන ලද දුනු "සින්දුර දුනු" විය හැකිය. සූර්යයා මෙන් ගෝලාකාර හැඩයකින් යුත් දුන්න "සූර්‍යවංක දුනු" නම් වේ (ආනන්ද හිමි, 1997: 100-101 පි.).

ජාතක අටුවා ගැටපදයේ "බුරප්පාදයො" යන්නට " මැඩහඟුදුනු ශර ආදීහු" වශයෙන් අර්ථ දක්වා තිබේ (ජාතක අටුවා ගැටපදය, 1961: 43 පි.). පූජාවලිය හා ධර්ම ප්‍රදීපිකාව වැනි කෘතීන්හි ද "මැඩහඟු" දුන්න පිළිබඳ සඳහන් වේ (ධර්ම ප්‍රදීපිකාව, 1951: 221 පි.). සද්ධර්මරත්නාවලියේ දහසක් දෙනා නගාලන "මැඩහඟු


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

දුන්න" පිළිබඳ සඳහන් වේ (සද්ධර්මරත්නාවලිය, 1961: 246 පි.). ජාතක අටුවා ගැටපදයේ "සහස්සත්ථාමං ධනුං" යන පදයට "දහසක් අතින් හෙවත් දහස් දෙනා විසින් නගනු බහනු කට හැකි ඒ සා ශක්ති ඇති දුන්න" වශයෙන් අර්ථ දක්වා තිබේ (ජාතක අටුවා ගැටපදය, 1961: 319 පි.). සද්ධර්මරත්නාවලිය දහසක් දෙනා නඟන දහසක් දෙනා බාන දුන්නක් පිළිබඳව සඳහන් කරන අතර (සද්ධර්මරත්නාවලිය, 1961: 1181 පි.) පූජාවලිය ද දහසක් පුරුෂයන් නගාලන බාලන දුන්නක් පිළිබඳ සඳහන් කරයි (පූජාවලිය, 1951: 407 පි.).

පාළි බෝධිවංස ගැටපදය "සහස්සූථා වූ දුනු නම් දහසක් දෙනා එකවිට ගෙන අදනෙන් කියන දෙයක් නොවෙයි. එදුන්නෙහි දිය නහා මධ්‍යම පුරුෂයන් දහසක් දෙනා උසුලන පමණ සිහිවල් පලු ඇ කිසි කවර භාරයක් දුනුදිය මැද බැඳ දුනුමිට ගෙන අහසට නගන කලැ සරයක් හිඳුවා අදනා පමණ නැමෙත් මිස එයින් වඩා නොනැමී එබර ගෙන අහසට නැඟෙන දුන්න." යනුවෙන් එය විස්තර කරයි (පාළි බෝධිවංස ගැටපදය, 1957: 48 පි.). මෙය අතිශක්තිමත් දුන්නක් හැඳින්වීම සඳහා යෙදූ නාමයක් මිස සත්‍ය වශයෙන්ම එවැනි දුනු වර්ගයක් තිබූ බව සිතීම අපහසුය. ප්‍රයෝජනය අනුව නම් කළ දුනු වර්ගයක් වශයෙන් ගල් දුනු දැක්විය හැකිය. මෙය හී වෙනුවට ගල් මුදාහළ දුන්නක් විය හැකිය.

පළමුවන පරාක්‍රමබාහු රජු රාමඤ්ඤ දේශයට විරුද්ධව පිටත් කර යවන ලද හමුදාව පිළිබඳ මහාවංසගත තොරතුරු මත පදනම්ව "ගෝකණ්ණ" නමින් හැඩහුරුකම අනුව නම් කළ ඇතුන්ගෙන් ආරක්ෂා වීම සඳහා භාවිත කළ විශේෂ හී වර්ගයක් ක්‍රි. ව. 12 වන සියවසේ ලංකාවේ පැවති බව විල්හෙල්ම් ගයිගර් සඳහන් කරයි (ගයිගර්, 1969: 229 පි.). කව්සිළුමිණ " මහකඩ" යනුවෙන් හී වර්ගයක් පිළිබඳ සඳහන් කරයි (කව්සිළුමිණ හෙවත් කුසදාවත, 1994: 680 කවිය). මෙය අඩසඳ වැනි තලයක් ඇති හීයක් විය හැකිය.

### 4.2. දුනු නිර්මාණ ශිල්පය

දුන්න නිර්මාණයේ දී ඒ ඒ පුද්ගලයාගේ දේහ ශක්ති ප්‍රමාණයට අනුරූපව නිර්මාණය කළ බව පෙනේ (ගමගේ, 1997: 59 පි.). දුනු වර්ගවලින් කොටසක් හෝ ඒවා නිෂ්පාදනය කරන ලද ද්‍රව්‍යය, හැඩය හා ප්‍රයෝජනය අනුව නම් කරන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. කලු, කලුවැල්, සින්දුරන් ආදී වශයෙන් නම්කර ඇති දුනු ආශ්‍රයෙන් දුනු නිෂ්පාදනය කිරීමට ගන්නා ද්‍රව්‍ය පිළිබඳ අනුමාන කළ හැකිය (කුලතුංග, 1988: 155 පි.).

ශුණ්ඩාකාර දෙකෙළවර කරා කුඩා වන ආකාරයෙන් තනි සිලින්ඩරාකාර දණ්ඩකින් යුත් දුන්න සරල සිංහල දුන්න වේ. දුන්නෙහි එක් එක් කෙළවරේ කත්තුව බැගින් කපා ඇති අතර ඇතැම් විට කෙළවරට අඟලක් පමණ ඈතින් කෙඳි සහ මැලියම් මිශ්‍ර කොට ඝන මුද්දක් යොදා තිබේ. නුග අරළු පට්ටා, නියඳ, ගෝන බඩවැල් යන මේ ද්‍රව්‍යයකින් කරන ලද දුනු ලණුවේ තොණ්ඩුව යොදනු ලබන්නේ ඉහත සඳහන් කළ ක්‍රම 2 න් එක් ක්‍රමයක් උපයෝගී කොටගෙනය. බොහෝ විට දුනු ලණුවේ එක් කොනක් දුනු දණ්ඩේ එක් කොනකට ස්ථිරව සම්බන්ධ කොට ඇත. භාවිතයට අවශ්‍ය වූ විට පමණක් අනික් කොන යොදනු ලැබේ (Deraniyagala, 1942: p.124). දුනු මුණ්ඩය වැනි නාමයන් පිළිබඳ පඤ්චිකාප්‍රදීපයේ සඳහන් වේ (පඤ්චිකාප්‍රදීපය, 1896: 12 පි.).

පී. ඊ. පී. දැරණියගල සහ විමලානන්ද තෙන්නකෝන් පවසන ආකාරයට මහ දුන්න හෙවත් උස දුන්න වූ කලී සරල දික් දුන්නකි. එය සාමාන්‍යයෙන් භාවිත කරන්නාගේ උසට වියතේ සිට වියත් තුන දක්වා වූ ප්‍රමාණයක් දිගින් වැඩිය. මිටි දුන්න වූ කලී දික් දුන්නට වඩා කුඩා වූ එහෙත් මහතින් වැඩි වූ ද වඩා කාර්යක්ෂම වූ ද දුනු විශේෂයකි. යුද්ධ දර්ශන නිරූපණය කෙරෙන පැරණි බිතු සිතුවම්වල මෙය සුලභය. මෙයින් සමහරක් සිලින්ඩාකාර දුනු මිටකින් හෙවත් දුනු මුඩාවකින් ද පිට පැත්ත නතෝදර ලෙස හෝ සමතලාවට ගාන ලද නමුත් ඇතුළු පැත්තේ හෙවත් බඩ පැත්තේ මිටේ සිට දෙකෙළවරට තුන්හුලස්ව ගාන ලද දුනු දණ්ඩකින් ද යුත් තනි දුනුයි. බැමි දුන්න වඩා විශිෂ්ටය. මෙහි දුනු දණ්ඩේ දිග හැරෙන ශක්තිය සහ බලය දියුණු තියුණු කරන පිණිස දැව දෙතුන් වර්ගයක් හෝ අං එක මත එක තබා බඳිනු ලැබේ. මේ ගණයට අයත් දුනු දණ්ඩක අභ්‍යන්තර දැවය සඳහා පුවක් හෝ කිතුල් යොදා ගනී. දුනු සෑදීමට වැඩි වශයෙන් ගන්නා ගැටවරා, තරඹු, වේවැල් හෝ

කුකුරුමාන් බාහිර නතෝදර දැවය වශයෙන් ගන්නා ලදී. මේ දැව දුන්නේ මැදට කිට්ටුවෙන් පටි 3 කින් හෝ සමාන දුරින් යොදන ලද පටි 8 කින් හෝ 9 කින් බැඳ ඇති බව පැරණි බිතු සිතුවම්වලින් හා කැටයම්වලින් පිළිබිඹු වේ. ඇතැම් විට දුනු දණ්ඩේ එක් කොනක ත්‍රිශූලයක් හෝ පොරවක් නිරූපිතය. එසේ නිර්මාණය කරන ලද්දේ ඊතල නිම වූ විට භාවිත කිරීම සඳහා බව පැහැදිලිය (Deraniyagala, 1942: p.123-124; විමලානන්ද, 1962: 435 පි.).

හරස් දුන්න, දුනු මඩලය සහ යතුරු දුන්න වැනි විවිධාකාරයෙන් හරස් දුනු පැවති බවද ඇතැම් දුනු සම්මිශ්‍රිත ඒවා වූ අතර තවත් සමහරක් සාවයව විය. දැරණියගල පවසන ආකාරයට සබරගමුවේ පැල්මඩුල්ල ප්‍රදේශයේ පවත්නා මුඛ පරම්පරාගත කතා අනුව එම ප්‍රදේශයේ දුනුකාරයන් කැබලි 3 කින් යුත් දුනු භාවිත කර තිබේ. භාවිතය සඳහා අවශ්‍ය වූ විට එකී කැබලි සන්ධි කරන ලදී. දුනුකාරයින් වර්ෂයකට දින 15 ක් සේවය කළ යුතු හෙයින් රජු දුනුවායන් කැඳවූ විට පටබැන්දා ද වැදි ලේකම හෙවත් දුනුකාරයින්ට අණදෙන නිළධාරි තැන හෝ පැල්මඩුල්ලට නුදුරු උඩකඩ දුනුකාරයෝ ද තම මිනිසුන් රැස් කොටගෙන ආහාරපාන සහිතව බලංගොඩ හා කොටියාගල හරහා මහනුවරට ගමන් කළ බව දැරණියගල සඳහන් කරයි (Deraniyagala, 1942: p.124). වටිනාකමින් වැඩි දුන්න මාළුවෙකුගේ පිටේ හැඩය ගනී. එය භාවිත කරන්නාගේ අත් රියනෙන් රියන් 3 ක් වේ. අවශ්‍ය නම් දිග අඩු කළ හැකි නමුත් අඩු කරන ප්‍රමාණය වියතකට වැඩි නොවිය යුතුය. හොඳම දුනුවල හීය, දුන්නේ දිගින් භාගයකි (කුලතුංග, 1988: 161 පි.). දුන්න මුල පටන් අග දක්වා නැමී තිබෙන බව සද්ධර්මරත්නාවලියේ සඳහන් වේ (සද්ධර්මරත්නාවලිය, 1961: 180 පි.).

### 4.3. හීය හෙවත් ඊතලය

දුන්න හා සම්බන්ධ අනෙක් වැදගත්ම අංගය හීය වේ. දුන්න ප්‍රහාරක උපකරණය වන අතර ඉලක්කය වෙත ළඟාවන කොටස හීය වේ. අභිධානප්පදීපිකාවේ හීය " සරො", "පත්ති", "සායකො", "බාණො", "කණ්ඩ", " මුසු", "බුරප්පො", "තෙජනා", "සනං" වශයෙන් හඳුන්වා තිබෙන අතර (අභිධානප්පදීපිකා නම් පාලිනිඝණ්ඩුව, 1960: 377 පද්‍යය) ධම්පියා අටුවා ගැටපදයේ "කඬ" යනු ඊතලය බව අර්ථ දක්වයි (ධම්පියා අටුවා ගැටපදය, 1960: 316 පි.). ධම්පියා අටුවා ගැටපදයේ "හී වඩු" යනු ඊතල සාදන වඩුවා බව දැක්වේ (ධම්පියා අටුවා ගැටපදය, 1960: 141, 414 පි.). දඹදෙණි අස්න ද හී වඩුවන් පිළිබඳ සඳහන් කරයි (දඹදෙණි අස්න, 1928: 5 පි.). සද්ධර්මරත්නාවලියේ හී නිෂ්පාදනය කරන ආකාරය පිළිබඳ ඇතැම් තොරතුරු ඉදිරිපත් වේ. "හී වඩුවෙක් වලින් දණ්ඩක් කපාගෙන වුත් සුඹුලුත් බොරු හරත් හැර පියා තෙල් ගා ගින්නට පෑ තවාලා ගස් හස්සෙක ලා හැද මැඩලා වක් ගුණ හැද ගුණ හැරලා බැඳ පත් සදා හී දඬු ඉදිකොට ගෙන රජ, යුවරජ, මහ ඇමැති ආ දීන්ට දක්වා..." ආදී වශයෙන් සඳහන් වේ (සද්ධර්මරත්නාවලිය, 1961: 314-315 පි.). බෙහෙවින් පසුකාලීන අවධියේ රචනා කරන ලද මන්දාරම්පුර පුවතෙහි පද්‍ය කීපයක හී වඩුවන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් වේ.

"අලවතු පිටිය සහ වැදි පස් කුල ද වෙන
අච්චිල්ලා තිදෙන ද හී වඩු ස දෙන
පෙරදිග බෙලිහුලින් සරු මනරම් උ යන
යොදුන් අඩගව්ව හැම විදි සලස මින"

"ගුණමා, වලඹුවා යන හී වඩුවන් න
මහරාබද්ද, කොටිකාබද්ද වෙන වෙ න
සලසා ගම්පංගුව ද විදි ලෙස දෙමින
හී වඩුකමේ පණිවුඩ මේවර ද දුන"

(මන්දාරම්පුර පුවත, 1996: 133 පද්‍යය, 145 පද්‍යය)

පුරාණතම හී තල පත්‍රාකාර විය. හීයෙහි තලය දණ්ඩේ සිදුරකට සවි කරන්නට ඇත. පසුකාලයේ දී භාවිතයට පැමිණි "ගොක්කන" වර්ගයේ ඊ තලවලට දිවතක් තිබුණි. මෙය හී දණ්ඩට සවිකරන ලද්දේය. පසු කලෙක ඊතලය සවි කිරීම පිණිස ඊ දණ්ඩට විල්ලක් දමන ලදී (විමලානන්ද, 1962: 436 පි.). තලය සතුරා වෙත ඇනුණු විට දණ්ඩ ගැලවී වැටෙන ආකාරයෙන් බුරුලට සවි කරන ලද හී ද භාවිත කරන ලදී. මේ නිසා කටු සහිත ඊතල ගලවා දැමීම අසීරු විය. ඇතැම් ඊතලයකට කටු 4 ක් තිබුණි. උල් ඉදිරියට හැරුණු අර්ධ චන්ද්‍රාකාර ඊතල ද ත්‍රිශූලයේ නොයෙක් හැඩ ද පොදු විය. එහෙත් නවීනතම සිංහල යුද හීයට, මහතින් හී දණ්ඩට වඩා විශාල නොවන තලයක් විය. මෙහි විනිවිද යන ශක්තිය


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

අධික බව නිසැකය. හීයක පගිලියේ පෙති ගණන විවිධ විය. ඇතැමකට 5 ක් තිබුණි. මේවා සකසන ලද්දේ මොණර පිහාටුවලිනි. ඇතැම් දළ දඬු කොළවල කැබලි පවා යොදන ලදී. මේවා කෙඳිවලින් හී දණ්ඩට බඳින ලදී. නැතහොත් මැලියම්වලින් අලවන ලදී. එසේත් නැතහොත් පටු තව්වල යොදා අලවන ලදී. තව්වට ඉදිරියෙන් හී දණ්ඩ කෙඳිවලින් බැඳ ලාටු යොදා ශක්තිමත් කරන ලදී. මෙසේ සිදු කරන ලද්දේ හී දණ්ඩ පැළීම වළක්වනු පිණිසය (Deraniyagala, 1942: p.124-125; විමලානන්ද, 1962: 436 පි.).

සාහිත්‍යමය මූලාශ්‍රය විමසන විට හල්ලුකගේ හී පහරින් දුටුගැමුණු රජු බේරා ගැනීම සඳහා ඵුස්සදේව විසින් විදින ලද හීය ගෙන්වා, තලය සෘජු කොට පගිලියේ තබා කහවණු පුරවා ඒ හීය වස්සවා ඵුස්සදේවට දුන් බවට මහාවංසයේ දැක්වෙන සඳහන අනුව (මහාවංසය, පරි. 25, 98-100 ගාථා) වරක් භාවිත කළ හීයෙහි තලය නැවත සකස් කොටගත් ආකාරයක් ඉස්මතු වේ. ජාතක අටුවා ගැටපදයේ "උසුකාරො තෙජනං ඉව" යන්නට "ශර සෘජුකරන්නා වූ හී වඩුවකු ශර සෘජු කරන්නාක් මෙන්" යනුවෙන් අර්ථ දක්වා තිබේ (ජාතක අටුවා ගැටපදය, 1961: 103 පි.). ශර සෘජු කිරීම යනුවෙන් එක් වරක් භාවිත කිරීම නිසා ඇද වී ගිය ඊතලයක් නැවත ප්‍රකෘතිමත් කිරීම අදහස් කළ බව පෙනේ.


### 4.4. දුනු භාවිතය

දුනු භාවිත කරන්නා හෙවත් දුනුවායා ජාතක අටුවා ගැටපදයේ "ධනුග්ගහ" ලෙස හඳුන්වා තිබෙන අතර (ජාතක අටුවා ගැටපදය, 1961: 37 පි.) මහාවංසයේ " ධනුර්ධර" ලෙස හඳුන්වා තිබේ (මහාවංසය, 2018: පරි. 72, 280-283 ගාථා, පරි. 83, 45 ගාථාව). ධම්පියා අටුවා ගැටපදයේ "දුනුවාවන්" යනු ධනුර්ධරයා ලෙස අර්ථ දක්වා තිබේ (ධම්පියා අටුවා ගැටපදය, 1960: 50 පි.). මැදිරිගිරිය ස්ථම්භ ලිපිය, රඹෑව ලිපිය විමසන විට දුනුගත් සෙබළා යන අර්ථයෙන් "දුනුවාබලත්" ලෙස සඳහන් වේ (Wickremasinghe, 1928: p.29, 67). දුනුවායන් පිළිබඳ රොට්ටකුළම, දඹුල්ල, හිඳගල වැනි පූර්ව බ්‍රාහ්මී ලිපිවල මෙන්ම (Inscription of Ceylon, Vol. I, 1970: No. 490, No. 846, No. 1136) කදුරුවැව වැනි අපර බ්‍රාහ්මී ලිපිවල (Inscription of Ceylon, Vol. II, pt. I, 1983: No. 39) තොරතුරු සඳහන් වේ. යම් දුනුවායෙක් විශිෂ්ට සාමර්ථ්‍යයක් දැක්වුවහොත් තෑගි සහ "ධනුර්ධරයා" යන පදවිය පිරිනැමීමෙන් ගෞරව කළ බව දැරණියගල සඳහන් කරයි (Deraniyagala, 1942: p.124). දුනු පිළිබඳ ශිල්පය "ධනු ශිල්ප" වශයෙන් සඳහන් වන අතර පූජාවලියේ දුනු ශිල්පය පිළිබඳ සඳහන් හමු වේ (පූජාවලිය, 1951: 408 පි.). දුනු ශිල්පය අෂ්ටාදශ විද්‍යාවන්ගෙන් එකක් ලෙස දඹදෙණි අස්න සහ පූජාවලිය කෘතීන්හි හඳුන්වා තිබේ (දඹදෙණි අස්න, 1928: 1 පි, පූජාවලිය, 1951: 151 පි.). මැදිරිගිරිය ස්ථම්භ ලිපිය අනුව මේ සඳහා වෙනම දෙපාර්තමේන්තුවක් පැවති අතර එය "දුනුමඩුලු" වශයෙන් හඳුනාගත හැකිය (Wickremasinghe, 1928: p.29). දුනුකම් පුරුදු කිරීම "සරාභ්‍යාසො", "පාසනං" යනාදී වශයෙන් අභිධාප්පදීපිකාවෙහි හඳුන්වා තිබෙන අතර (අභිධානප්පදීපිකා නම් පාලිනිඝණ්ඩුව, 1960: 379 පද්‍යය, 89 පි.) නුවරකන්ද සෙල්ලිපියේ "ධනු අචරිය" යනුවෙන් දුනු ශිල්පය ඉගැන්වූවෙකු පිළිබඳ සඳහන් වේ (Inscription of Ceylon, Vol. I, 1970: No. 925).

දුනු භාවිතයේ දී ඊතල තබා ගැනීම සඳහා කොපුවක් ද භාවිත කර ඇති අතර "හියවුර" ලෙස හැඳින්වූ මෙය පිටෙහි එල්ලාගත් බව පෙනේ. අභිධාප්පදීපිකාවෙහි "තූණි", "කලාපො", "තූණො", "තූණීර", "බාණධි" යන නාමයන් හියවුර සඳහා භාවිත කර තිබේ (අභිධානප්පදීපිකා නම් පාලිනිඝණ්ඩුව, 1960: 378 පද්‍යය). මෙය කව්සිළුමිණේ "ඉයොර" හෙවත් "තූනීරය" වශයෙන් සඳහන් වේ (කව්සිළුමිණ හෙවත් කුසදාවත, 1994: 672 කවිය). එහි දැක්වෙන ආකාරයට තමන්ගේ හියොවුර හිස් වන කල්හි තමන්ගේ පපුවේ ඇමිණී තිබූ හී උගුලාගෙන විදන්නා වූ ඇතැම් යුධ භටයන් තම පපුවෙහි පළල පිළිබඳ සතුටු වී තිබේ (කව්සිළුමිණ හෙවත් කුසදාවත, 1994: 672 කවිය). පාළි බෝධිවංස ගැටපදය "තූණීරස්ස" ලෙස මෙය හඳුන්වා තිබෙන අතර (පාළි බෝධිවංස ගැටපදය, 1957: 48 පි.) "ආදාන" යනු "හියවුරෙන් හී ගැනීම" ලෙස අර්ථ දක්වා තිබේ (පාළි බෝධිවංස ගැටපදය, 1957: 49 පි.). ධර්ම ප්‍රදීපිකාවේ හියොවුර දකුණු සරියෙහි බැඳීම පිළිබඳ සඳහන් වේ (ධර්ම ප්‍රදීපිකාව, 1951: 221 පි.). දුන්න සමඟ හියවුර රැගෙන යාම පිළිබඳ පූජාවලියේ සඳහන් වේ (පූජාවලිය, 1951: 407 පි.). යුද්ධයක දී භටයෙකුට අවශ්‍ය වන තරම් හී ප්‍රමාණයක් එක් කොපුවක බහාලීමට හැකි වුවා ද යන්න සැක සහිතය. එසේ නම්


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

යුද්ධ භූමියට හී ප්‍රවාහනය සඳහා යම්කිසි ක්‍රමවේදයක් හා සේවක පිරිසක් සිටින්නට ඇතැයි අනුමාන කළ හැකිය. යුද්ධයකදී දෙපක්ෂය විසින් විදිනු ලබන හී ඔවුනොවුන්ට නැවත රැස්කර ගැනීමට හැකියාවක් තිබෙන්නට ද ඇත. ඉහත දැක්වූ ආකාරයට තමන්ගේ හියොවුර හිස් වන කල්හි තමන්ගේ පපුවේ ඇමිණි තිබූ හී උගුලාගෙන විදින්නා වූ ඇතැම් යුධභටයන් පිළිබඳ කව්සිළුමිණේ සඳහන් වේ (කව්සිළුමිණ හෙවත් කුසදාවත, 1994: 672 කවිය).



**ඡායාරූපය 1. දඹුල්ල විහාරයේ අංක 02 ලෙනෙහි ඇතුළත නැගෙනහිර බිත්තියේ දේවානම්පියතිස්ස රජුගේ මුව දඩයම දැක්වෙන සිතුවම් (ශ්‍රී ලංකා බිතු සිතුවම් දඹුල්ල, 1990: 111)**

පූජාවලිය විමසන විට ශර පුවරු, ශර තොරණ, ශර පොකුණු, ශර ප්‍රසාද, ශර රථ, අක්ෂණවේධී, ශබ්දවේධී, වාලවේධී, ශරවේධී, ගොඩවිදමන, දියෙහි විදමන, ආකාශ විදමන, දුර විදමන, ආසන්න විදමන, යපට විදමන, තඹපට විදමන, පිදුරු බිසි විදමන, වැලි බිසි විදමන, මීහං විදමන, උදළුතැටිලි විදමන, දිඹුල් පෝරු පියා පෝරු විදමන ආදී වශයෙන් නොයෙක් ධනු ශිල්ප පිළිබඳ හඳුනාගත හැකිය (පූජාවලිය, 1951: 151 පි.). දුන්නෙන් විදින ඉලක්කය "ලක්ඛං", "වේජ්ඣං", "සරව්‍යං" වශයෙන් අභිධාප්පදීපිකාවෙහි හඳුන්වා තිබේ (අභිධානප්පදීපිකා නම් පාලිනිඝණ්ඩුව, 1960: 379 පද්‍යය).

පාළි බෝධිවංස ගැටපදය විමසන විට "ආදාන", "සන්ධාන", "ආකර්ෂණ", "සන්ධාරණ", "මෝක්ෂ" වශයෙන් හියවුරෙන් හී ගැනීම, එම හීය දුනු දියෙහි හිඳුවීම, දුන්න ඇදීම, දෘශ්‍යමාන වූ ලක බලා හැම්මීම, ශරය ගැළවීම ආ දී වශයෙන් දුන්නෙන් හී විදීමේ පියවර පිළිබඳ තොරතුරු ඉදිරිපත් වේ (පාළි බෝධිවංස ගැටපදය, 1957: 48-49 පි.). හීයෙන් විදින ආකාරය පිළිබඳ පූජාවලියේ තොරතුරු සඳහන් වේ. සිද්ධාර්ථ කුමාරයා තමා උගත් ශිල්ප ශාස්ත්‍ර ඥාතීන්ට දැක්වීම සම්බන්ධ තොරතුරුවල දී "දුන්නක් ගෙන්වා යටි පිලාව වම්පය මාපට ඇඟිල්ලෙහි නිය පිට තබා උන් පොළින් නොසොල් වී රොද්දක් නගන්නා සේ ඒ දුන්න නැගා දුනුදිය අත් පොළාපු දැය..........." වශයෙන් සඳහන් වන අතර (පූජාවලිය, 1951: 150 පි.) සද්ධර්මරත්නාවලිය "දහසක් දෙනා නඟන දහසක් දෙනා බාන දුන්න ගෙන්වා ලා සිංහාසනයේ හිඳම දුනු දිය පය මාපට ඇඟිල්ලෙන්ම දුන්න නගාලා වමතින් දුන්න අල්වාගෙන දකුණතින් දුනු දිය අත පොළා ලූ දැය." වශයෙන් සඳහන් වේ (සද්ධර්මරත්නාවලිය, 1961: 1181 පි.). දුන්නක් ගෙන හීය තබා ඇද විදීමට සැරසීම පිළිබඳ මෙන්ම තියුණු හීයක් දුනුපිට තබා තදව ඇද විදීම පිළිබඳ සද්ධර්මරත්නාකරයේ තොරතුරු සඳහන් වේ (සද්ධර්මරත්නාකරය, 1955: 58, 386 පි.). හීය වේගයෙන් විදීම සඳහා තමා කැරකී දුන්න ඇදීම පිළිබඳ කව්සිළුමිණ තොරතුරු ඉදිරිපත් කරයි. ඒ අනුව එක් දක්ෂ භටයෙක් සරොස්ව වටේ කරකවා දුන්න අදින කල්හි තම තමාගේ හිස් කපතැයි සේනා දෙකෙහිම භටයන් සැක කළ බව සඳහන් වේ (කව්සිළුමිණ හෙවත් කුසදාවත, 1994: 681 කවිය).


*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka.* jahs@ssh.rjt.ac.lk



**ඡායාරූපය 2. දඹුල්ල විහාරයේ අංක 2 ලෙනෙහි ඇතුළත වියන් තලයේ කතරගම දෙවියන් දැක්වෙන සිතුවම, දකුණු අතක ඊතලයක් ද වම් අතක දුන්නක් ද තිබේ (ශ්‍රී ලංකා බිතු සිතුවම් දඹුල්ල, 1990: 127)**

ඇතැම් දුනු භාවිත කරන ලද්දේ හිඳීමේ ඉරියව්වෙනි. මෙහි දී සාමාන්‍ය සිංහල තනි දුන්න හරස් දුන්නක් වශයෙන් භාවිත කරන ලදී. දුනුවායා බිම වාඩි වී දුනු දණ්ඩ තම පා යටිපලවල ගැටෙන සේ තබා ගෙන දුනු ලණුව ඇදීම සඳහා දෑත සහ සිරුර යෙදවීය. දුනුවායා එක් දණහිසකින් දණ ගසා හෝ ඍජුව නැඟී සිට හෝ දුන්න භාවිත කළේය. සිංහල දුනුවායන් විසින් සාමාන්‍යයෙන් දබරැඟිල්ල සහ මැදැඟිල්ල දුනු දිය වටා යොදා මහපටැඟිල්ලෙන් හීය හසුරුවා දුන්න ඇදීම සහ අත හැරීම සිදු කරන ලදී (Deraniyagala, 1942: p.124.). මෙහිදී පළල් ලෝහමය වළලු ඇතුළු බාහු බන්ධන හෝ රක්ෂණ භාවිත විය. ජංඝාත්‍රාණ (කකුල් වැස්ම) සහිත ධනුර්ධරයන් දළමුවා කැටයම්වලින් නිරූපිතය. විදීමේ දී හීය තබා ගත් ආකාරය විවිධය. බොහෝ විට දුනු දණ්ඩ අල්ලා ගන්නා අතේ ඌර්ධව බාහුවෙන් හා හීයෙන් කතිරයක් සෑදෙන සේ හීය යෙදිණි (විමලානන්ද, 1962: 435-436 පි.). රථයන්හි සිට දුනු විදීම පිළිබඳ සද්ධර්මරත්නාවලියේ තොරතුරු හමු වේ (සද්ධර්මරත්නාවලිය, 1961: 358-359 පි.).


මහාවංසයේ සඳහන් වන "යුද්ධෙ ජාවකයොධෙහි යන්ත මුත්තෙ ලහුං ලහුං විස දිද්ධමුඛ්බොණෙ බහුධාභිමුඛාගතෙ" යන ගාථාව (ඌනපූරනසහිතො මහාවංසො, 2018: පරි. 81, 44 ගාථාව) පදනම් කරගෙන චන්ද්‍රභානු සමඟ පැමිණි ජාවක භටයන් යුද්ධයේ දී භාවිත කළ හී විදින ලද යන්ත්‍රයක් පිළිබඳ විල්හෙල්ම් ගෛගර් සඳහන් කරයි (ගයිගර්, 1969: 229 පි.). මහාවංසයේ ඇතැම් සිංහල සංස්කරණයන්හි ද " යුද්ධයේ දී ජා යෝධයන් විසින් වහ වහා යන්ත්‍රයෙන් විදින ලද බොහෝ සෙයින් අභිමුඛව ආවා වූ විස පෙවූ මුඛ ඇති සරයන්..." ලෙස දැක්වේ (මහාවංසය, 2018: පරි. 83, 44 ගාථාව).

සාහිත්‍යමය මූලාශ්‍රය විමර්ශනය කිරීමේ දී පුරාතන ශ්‍රී ලංකාවේ යුධමය කටයුතු මෙන්ම වෙනත් කටයුතු සඳහා දුනු භාවිතයේ විවිධ අවස්ථා පිළිබඳ තොරතුරු රාශියක් ඉදිරිපත් වේ. පුරාතනයේ සිට බෙහෙවින් ප්‍රචලිත වූ දුන්න ප්‍රමුඛ ආරක්ෂක මෙවලමක් ලෙස හැඳින්විය හැකිය. යුධමය කාර්යයන් හා සම්බන්ධව රජුගේ සිට සාමාන්‍ය සෙබලා දක්වා විවිධ පිරිස් දුන්න භාවිතයට ගෙන තිබේ.

## 4.5. රාජකීයයන්ගේ දුනු භාවිතය

දුනු භාවිතය පිළිබඳ විමසන විට විජය කුමරුගේ පිරිස පැන් ගෙන ඒමට පිටත්ව නැවත නොපැමිණීම නිසා ඒ පිළිබඳ සොයා බැලීමට විජය කුමරු ගිය විට තවුස් වෙස් ගෙන සිටි කුවේණියගෙන් තම පිරිස පිළිබඳ විමසා සිටි අතර ඇය යක්ෂණියක බව දැන තම දුන්න


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk



**ඡායාරූපය 3. හඟුරන්කෙත විහාරයේ දුටුගැමුණු හා භල්ලුක අතර සටන දැක්වෙන සිතුවම (ශ්‍රී ලංකා බිතුසිතුවම් හඟුරන්කෙත, 1990: 95)**

සරසාගෙන ඇය වෙත එළඹී බව සඳහන් වේ (මහාවංසය, 2018: පරි. 7, 16-20 ගාථා). මිහිඳු හිමියන් වැඩමවීම පිළිබඳ මහාවංසයේ දැක්වෙන තොරතුරු විමසන විට දේවානම්පියතිස්ස රජු දඩයමට යෑමේ දී දුන්න රැගෙන ගිය ආකාරය හඳුනාගත හැකි අතර (මහාවංසය, 2018: පරි. 14, 04 ගාථාව) (ඡායාරූපය 1) මිහිඳු හිමි ඇතුළු පිරිස මුණගැසීමෙන් අනතුරුව දුනු හී පසෙක දැමූ බව දැක්වේ (මහාවංසය, 2018: පරි. 14, 04 ගාථාව). සත් ද්‍රවිඩයන් වෙතින් පැරද පලාගිය වළගම්බා රජු ඇතුළු පිරිස තනසීව වෙතින් උපස්ථාන ලබමින් සිටින විට තනසීව විසින් අනුලා දේවියගේ පැස පයින් පහළන ලද අතර ඇය විසින් රජුට එය දැන්වූ පසු අතර එය ඇසූ රජු කෝපයට පත්ව දුන්න සරසාගෙන නික්ම තනසීව විද මරා දමා තිබේ (මහාවංසය, 2018: පරි. 33, 64-67 ගාථා). රජ කුමාරවරුන්ගේ අධ්‍යාපනයේ මූලික අංගයක් බවට දුනු ශිල්පය පත් වූ අතර ඔවුන් දුනු ශිල්පය ප්‍රගුණ කළ බවට තොරතුරු ඉදිරිපත් වේ. පොළොන්නරු රාජධානි සමයේ දී පළමුවන විජයබාහු හෙවත් කීර්ති කුමරු තෙළෙස් හැවිරිදි වියේ දී ධනු ශිල්පයෙහි කෘතහස්ත වූ බව මහාවංසයේ සඳහන් වේ (මහාවංසය, 2018: පරි. 57, 44-45 ගාථා). තවද පළමුවන පරාක්‍රමබාහු කුමරු නීති ශාස්ත්‍ර, කාව්‍ය ශාස්ත්‍රය නැටුම්, ගැයුම් ආදියෙහි මෙන්ම හස්ති ශිල්ප ශාස්ත්‍රයෙහි ද, දුනු, කඩු ආදී නොයෙක් ශාස්ත්‍රයන්හි පරතෙර පැමිණි බව දැකවේ (මහාවංසය, 2018: පරි. 64, 3-5 ගාථා). දඹදෙණි රාජධානි සමයෙහි දී දෙවන පරාක්‍රමබාහු කුමරු නොයෙකුත් විද්‍යා හා ශාස්ත්‍රයන් මෙන්ම ධනු ශිල්පය ආදී විවිධ ශිල්පයන් හදාරන ලද බව දඹදෙණි අස්න සඳහන් කරයි (දඹදෙණි අස්න, 1928: 1 පි.). මහනුවර රාජධානි සමයේ දෙවන රාජසිංහ රජු ලන්දේසීන් හා යුධ පිණිස ගමන් කිරීමේ දී දුනු, කඩු වැනි ආයුධ රැගෙන ගිය බවට තොරතුරු ඉදිරිපත් වේ (මහාවංසය, 2018: පරි. 96, 15 ගාථාව).

### 4.6. රණශූරයන්

රජුන් මෙන්ම බොහෝ සෙන්පතියන්, රණශූරයන්, සෙබළුන් ප්‍රධාන ආයුධයක් වශයෙන් දුන්න භාවිත කරන ලද ආකාරයක් හඳුනාගත හැකිය. කාවන්තිස්ස රජු ගොඩනැගූ දක්ෂ සෙන්පතීන් දස දෙනෙකු පිළිබඳ සඳහන් කරන මහාවංසය එම පිරිස අතර සිටි දුනු ශිල්පයෙහි දක්ෂ වූවන් පිළිබඳ තොරතුරු දක්වා තිබේ. දුටුගැමුණු රජුගේ සෙන්පතියෙකු වූ ඵුස්සදේව ධනු ශිල්පයේ පරතෙරට පැමිණියෙකු ලෙසට සඳහන් වන අතර ඔහු තම පරම්පරාවෙන් පැවැත ආ ශිල්පය තම පියා වෙතින් ඉගෙනගත් බව මහාවංසයේ (මහාවංසය, 2018: පරි. 23, 85 ගාථාව) මෙන්ම රසවාහිනියේ සඳහන් වන අතර (රසවාහිනී, 1961: 205 පි.) ඵුස්සදේව යෝධයා දොළොස් හැවිරිදි වියට පා තබන විට ඔහුගේ පියා විසින් ධනු ශිල්පය, හස්ති ශිල්පය, අශ්ව ශිල්පය, කඩු ශිල්පය ආදියෙහි දක්ෂ කරවූ බව සද්ධර්මාලංකාරයේ ඵුස්සදේව වස්තුවේ සඳහන් වේ (සද්ධර්මාලංකාරය, 1953: 519 පි.).



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

දුටුගැමුණු රජු හා හල්ලුක අතර ගැටුම පිළිබඳ සඳහන් කරන මහාවංසය ගැමුණු රජු හල්ලුකව රවටනු පිණිස සිය කඩුතලයෙන් මුව වසාගෙන ආක්‍රෝශ කරන ලද අතර හල්ලුක විසින් රජුගේ මුවට හීයෙන් විදින ලද බවත් එම හීය කඩුතලයෙහි වැදී බිම වැටුණු බවත් රජුගේ මුඛයට විදි බවට සතුටට පත් වී හල්ලුක ජය නාද පැවැත්වූ බවත් රජුට පසුපස අසුනේ සිට ක්ෂණයෙන් ක්‍රියාත්මක වූ ඵුස්සදේව විසින් රජුගේ කන අසලින් යන ආකාරයෙන් හල්ලුකගේ මුඛයට හීයක් විදින ලද අතර රජු දෙසට පා හෙලා වැටෙනා ඔහුගේ දණහිසට තවත් හීයකින් විද රජු දෙසට ඉසලා ඔහු සිටින ආකාරයෙන් හෙළන ලද බව සඳහන් වේ (මහාවංසය, 2018: පරි. 25, 88-92 ගාථා, වංසත්ථප්පකාසිනී, 1994: 386-387 පි.). (ඡායාරූපය 3) මෙම පුවත රසවාහිනිය, සද්ධර්මාලංකාරය වැනි මූලාශ්‍රයන්හි ද විවිධාකාරයෙන් විස්තර වේ (රසවාහිනී, 1961: 205-206 පි, සද්ධර්මාලංකාරය, 1953: 519-520 පි.). මෙහි දී රජුගේ කන අසලින් හීය විදීම නිසා එහි දෝෂය දක්වනු පිණිස ස්වකීය තන්වැල කඩා ලේ පතක් ගෙන රජුට දැක්වූ අතර රජු දෝෂයක් නැතැයි පවසා "හීයට සුදුසු වූ මහත් සත්කාර තට වන්නේ" යැයි පැවසූ බව මහාවංසයේ දැක්වේ (මහාවංසය, 2018: පරි. 25, 94-97 ගාථා). මෙම තොරතුරු අනුව හල්ලුක ද දුනු ශිල්පයෙහි දක්ෂයෙකු බව පැහැදිලිය.

පළමුවන පරාක්‍රමබාහු කුමරු දෙවන ගජබාහු රජු සමග සටනේ දී ව්‍යාජ මාවත් ඉදි කරවා එම මාර්ගයන්හි තීක්ෂණවේදී දුනුවායන් යොදවා දුර්ගය මැද සිවු මහල් පහයක් කරවා ඒ මත ඒ ඒ තැන්හි දුනුවායන් යොදවා අනතුරුව පසමිතුරු සේනාව අසළ පත් කරනු පිණිස දුනු හා ක්ෂණවේධී දුනුවායන් 3000 ක් පමණ යවා පසමිතුරු සේනාවට හී වර්ෂාවක් පැවැත්වූ බව මහාවංසයේ සඳහන් වේ (මහාවංසය, 2018: පරි. 72, 278-284 ගාථා). දෙවන ගජබාහු රජු ලංකාධිනාථගේ බළකොටු වට කර හී වර්ෂා වැස්සවූ බව දැක්වේ (මහාවංසය, 2018: පරි. 70, 116 ගාථාව). පළමුවන පරාක්‍රමබාහු රජු තම දුනුවායන් ලවා විටින් විට හී වර්ෂා පැවැත්වූ බවද සඳහන්ය (මහාවංසය, 2018: පරි. 72, 280-283 ගාථා, පරි. 74, 99, 120 ගාථා). දඹදෙණි රාජධානියේ දෙවන පරාක්‍රමබාහු රජු ධනුර්ධරයන් 900 ක් හා විවිධ පිරිස් ඒ ඒ ධූරවල නියුක්ත කරවූ බව දඹදෙණි අස්න දක්වයි (දඹදෙණි අස්න, 1928: 2 පි.). තවද කාලිංග මාඝ සමග යුද්ධයට යෑමේ දී ඔහුගේ සේනාවන් විවිධ වර්ගයන්හි අවි ආයුධ ගෙනගිය අතර එහි දී ගෙනගිය දුනු වර්ග 21 ක් පිළිබඳ දඹදෙණි අස්නේ සඳහන් වේ (දඹදෙණි අස්න, 1928: 6 පි.).

"ගජබඳීනි හිඹිළි කඬ සහලේ බළනුර ලගත්
ළෙන් නොසැනහී කෝ දල උතුළෙව් නුබද කිඳු දී"

(කව්සිළුමිණ හෙවත් කුසදාවත, 1994: 670 කව, 394 පි.)

ඇතුන්ගේ සිරුරු සින්දා වූ ලේ තැවරුණු ඊතල ඉන් නික්ම යුද්ධ භටයින්ගේ පපුවෙහි ලැගෙන ආකාරය පිළිබඳ කව්සිළුමිණ සඳහන් කරයි. ආරක්ෂාව පිණිස දුනුවායන් යෙදවීම විමසන විට දුන්නෙන් දුන්න පැහැර සිටිනා යුධක්ෂම ධනුර්ධරයන් වළල්ලක් සිටුවීම පිළිබඳ සද්ධර්මරත්නාකරයේ තොරතුරු ඉදිරිපත් වේ (සද්ධර්මරත්නාකරය, 1955: 273 පි.).

ධනු ශිල්පයේ පරතෙරට පැමිණියවුන් වර්ණනා කිරීමට මෙන්ම එහි විවිධ හැකියාවන් දැක්වීමට ද භාවිත කළ නම් රාශියක් මූලාශ්‍ර ඇසුරින් හඳුනාගත හැකිය. දුනු ශිල්පයෙහි දක්ෂ අක්ෂවේධී, ශබ්දවේධී, ක්ෂණවේධී ධනුර්ධරයෝ සිටිති. ඒ ඒ කොටස්වලට අයත් නායකයා හඳුනාගැනීමට විශේෂ ලාංඡන තිබුණි (ආනන්ද හිමි, 1997: 100-101 පි.). ධර්මප්‍රදීපිකාවේ ධනුර්ධරයන් ප්‍රභේද 4 ක් දක්වා තිබේ. එනම් "අක්ෂණවේධී", "වාලවේධී", " ශබ්දවේධී", "ශරවේධී" වශයෙනි (ධර්ම ප්‍රදීපිකාව, 1951: 221 පි.). ඵුස්සදේවගේ දක්ෂතා පිළිබඳ දැක්වීමේ දී ඔහු "ශබ්දවේධී", "විජ්ජුවේධී", "වාලවේධී", "ශරවේධී" වැනි නම්වලින් හඳුන්වා තිබෙන අතර (ඌනපූරණසහිතො මහාවංසො, පරි. 23, 86 ගාථාව) ඔහු එම ශිල්පයන්හි පරතෙරට උගත් බව සඳහන් වේ (සද්ධර්මාලංකාරය, 1953: 519 පි.). ඒ අනුව ඵුස්සදේව ශබ්දානුසාරයෙන් විදීමට හැකි අයෙකු ලෙස ද විදුලි එළියෙන් විදින සුළු වූවෙකු ලෙස ද වැලි පිරුණු ගැලකට හෝ සිදුරු වීමට විදිය හැකි බවද සම් පට 100 ක් හෝ අඟුල් 8 ක් ඝණකම ලෑල්ලකට හෝ අඟුල් 16 ක් ඝණකම දිඹුල් ලෑල්ලකට හෝ අඟුල් 2 ක් ඝණකම යකඩ පටයකට හෝ අඟුල් 4 ක් ඝණකම ලෝහ පටයකට හීයෙන් විදිය හැකි අතර හීය ද එකී දෑ විනිවිද යන බව දැක්වේ. තවද ඔහු ගොඩ ඉස්බ 8 ක් දුර ගමන් කරන අතර දියෙහි ඉස්බක් දුර ගමන් කරන සේ විදිය හැකි

දක්ෂයෙකු බව සඳහන් වේ (මහාවංසය, 2018: පරි. 23, 86-89 ගාථා, සද්ධර්මාලංකාරය, 1953: 519 පි.).

පාළි බෝධිවංශ ගැටපදය "අකුණුපහනැ ලක දැක දුන්නෙහි ශරය හිඳුවා ඇද ඒ ආලෝකය තිරෝහිත නොවන තුරු එලක විදිනේ "අක්ෂණවේධි" නම් වෙයි. සියක් දුනු පමණ තැන්හි සිට කරබටුපක සලකුණෙන් අස්වල් පලා විදපියනුයේ "වාලවේධි" නම් වෙයි. රජස්තමස් හිම ධූමයෙන් ප්‍රච්ඡන්නව ද සිට ශබ්දයාගේ උප්පත්ති ස්ථානයෙක්හි පුෂ්‍යදේව දශරථාදීන් සෙයින් විදපියනුයේ "ශබ්දවේධි" නම් වෙයි. ලක්ෂගත ශරයාගේ පුඩබයෙහි පටන්ගෙන පුඩබානු පුඩබ කොට ශර පරම්පරාවක් තමා සිටි තැන් දක්වා විද නිමාම්සැරයෙහි පුඩබය අතින් ගෙන සිටිනේ "ශරවේධි" නම් වෙයි." වශයෙන් දක්වා තිබේ (පාළි බෝධිවංස ගැටපදය, 1957: 47-48 පි.).

ශබ්දවේධී ක්‍රමය අනුව පුහුණුව ලැබූ ධනුර්ධරයින් හෝ තෝමර දමා ගසන්නන් සතාගේ හඬ හෝ සතුරාගේ කටහඬ හෝ අනුව කන යොමා විදීමට පුරුදු පුහුණු කරන ලද හෙයින් ශබ්දය නිකුත් වූ මුඛයට හෝ කණ්ඨයට විනා ශරීරයේ අන් කිසි කොටසකට පහරදීම තරම් නොවේ යයි සිතූ බව පෙනේ. දුටුගැමුණු රජුට විරුද්ධව සටන් කළ ද්‍රවිඩ සේනාධිපතියකු වූ භල්ලුක මේ ගණයට අයත් බව පැහැදිලි වේ (විමලානන්ද, 1962: 436 පි.). අක්ෂණවේධීහු වේගය ගරු කොට සළකන ලදී. අකුණු එළියකින් මොහොතක් වේලා දුටු සතුරකු මැරීම ඔවුන්ගෙන් අපේක්ෂිත විය. ඉලක්කයක් මෙන් එල්ලන ලද කෙස් ගසක් දෙකට පැළීමට තරම් දක්ෂතාවක් ලැබෙන තුරු ඇතැමෙක් පුරුදු පුහුණු වූහ. තවත් සමහරු හම් සිය පටක්, ලෝහ තහඩුවක් හෝ වැලි මල්ලක් විනිවිද යන තරම් වේගයක් ලබා ගත්හ (විමලානන්ද, 1962: 436 පි.).

රාත්‍රී කාලයේ සඳ එළියේ හී වි දීම සඳහා නිපුණත්වයක් ලබා සිටි චන්ද්‍රාලෝක ධනුර්ධර නම් දහසකින් සමන්විත දුනුවායන් හමුදාවක් පළමුවන පරාක්‍රමබාහු රජුට සිටි බවද ඔවුන්ට සම් සැට්ට ආදිය ලබාදුන් බව ද මහාවංසයේ සඳහන් වේ (මහාවංසය, 2018: පරි. 69, 20 ගාථාව). තවද පළමුවන පරාක්‍රමබාහු රජුගේ හමුදාව තුළ "තීක්ෂණවේධී", "ක්ෂණවේධී" දුනුවායන් සිටි බව සඳහන් වේ (මහාවංසය, 2018: පරි. 72, 279-280 ගාථා).

ඊතලවලට එරෙහිව ඊතලවලින්ම පහර දිය හැකි දක්ෂ සෙබළුන් සිටි බවට ද තොරතුරු ඉදිරිපත් වේ. යුද්ධයේ දී ජාවක යෝධයන් විසින් වහ වහා යන්ත්‍රයෙන් විදින ලද බොහෝ සෙයින් අභිමුඛව පැමිණියා වූ විස පෙවූ මුඛ ඇති සරයන් ලක්ෂ්‍යාවේදී වූ යම් ධනුර්ධර සිංහල මහා යෝධ කෙනෙක් තීක්ෂණ මුඛ ඇති හීයෙන් කඩ කඩ කොට කැඩූ බව මහාවංසයේ සඳහන් වේ (මහාවංසය, පරි. 2018: 83, 44-46 ගාථා). තවද කව්සිළුමිණේ දැක්වෙන ආකාරයට,

"වුහුටු සෙද දෙසෙන් නුබ වත් කඬ කඬින් ලගැ
සිවුරඟ සෙනඟ වැ නොරැ ඔවුනොවුන ලක් නොබිජු"

(කව්සිළුමිණ හෙවත් කුසදාවත, 1994: 664 කවිය)

යන්නෙහි අර්ථය විමසන විට සේනාවන් දෙක ශීඝ්‍රව විද්දා වූ ඊ එකිනෙක වැදී අහස සිටගත් කල්හි රාත්‍රිය නොවුවද චතුරංගනී සේනාව එකිනෙකාට ඉලක්ක නොවීය. (ඔවුනොවුන් හට නොපෙනුණාහ) වශයෙන් හඳුනාගත හැකිය. තවද එහිම දෙසේනාවන් විද්දා වූ ඊතල සහ කඩු එකිනෙකට ගැටීමෙන් ගිනි පුපුරු ඇති වූ බව

"අසි ගස් නෙනුදහන ගිනිරොණින සරනැලැළුම්
බිය බා දෙසෙන් වුදු සර නුබෙ බඳ දලවරණ පැ"

(කව්සිළුමිණ හෙවත් කුසදාවත, 1994: 665 කවිය)

යනුවෙන් සඳහන් වේ. ධර්මප්‍රදීපිකාවේ ජෝතිපාල නම් ධනු ශිල්පයෙහි මස්තක ප්‍රාප්ත වූ බමුණු දරුවෙකු පිළිබඳ පුවතක් වන අතර එයින් ඉතාම දක්ෂ දුනුවායන් සිටින්නට ඇති බව පැහැදිලි වේ. එහි දැක්වෙන ආකාරයට රජු විසින් ජෝතිපාලගේ ශිල්ප බැලීමේ අපේක්ෂාවෙන් ඔහුව කැඳවන ලද අතර ඔහු විසින් රජුගේ අක්ෂණවේධී, වාලවේධී, ශබ්ධවේධී, ශරවේධී යන දක්ෂ දුනුවායන් සතර දෙනෙකු ගෙන්වා සතර දෙස සිටුවා 30 000 බැගින් හී ඔවුන්ට ලබා දී මධ්‍යයෙහි සිට දුනුවායන් සතර දෙනාට එක්වර තමාට හීයෙන් විදින ලෙස දන්වා ඔවුන් විදි කල්හි එම හී නාරාචයෙන් පැහැර පැහැර යම් තැනකට දමා නොපියා මහබෝ කොටුවක් කරන්නාක් මෙන් තලයෙන් තලය, දණ්ඩෙන් දණ්ඩ, පත්කඩින් පත්කඩ, දැත්තෙන් දැත්ත නොඉක්මවා පැහැර බහා බහාලන


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

හීයෙන් හී ගර්භයක් කරන ලදී. ඔහු හී අවසන් බව දැන හී ගර්භය නොනසා රජු වෙත යන ලදී. මෙය කුමන ශිල්පයක් දැයි රජු විමසූ විට එය "ශර ප්‍රතිබාධන" නම් වන බව ඔහු පැවසූ බව සඳහන් වේ (ධර්ම ප්‍රදීපිකාව, 1951: 221-222 පි.).

තවද සතර කෙනක සිටිනා අයට එක හීයකින් විදීම වශයෙන් කෙසෙල් ගස් 4 ක් සිටුවා රත් හුයක් බැඳ විදින ලද අතර එය කෙසෙල් ගස් 4 ම පසාරු කොටගෙන පැමිණි බවද එම ශිල්පය "චක්‍රවේධ" නම් වූ බවද සඳහන් වේ (ධර්ම ප්‍රදීපිකාව, 1951: 222 පි.). හී 2 ක් විද නැවත තමා සිටි තැනට පැමිණීමට සැලැස්වූ අතර එම ශිල්පය "ශරයෂ්ටි" නම් වූ බව සඳහන් වේ. තවද වැලියෙන් වැටූ රැහැනක් සේ "ශර රජ්ජු" නම් ශිල්පයක් ද, නොයෙක් දඟයෙන් ගැවසූ වෙණියක් සේ "ශරවෙණි" නම් ශිල්පයක් ද, අහසෙහි හීයෙන් ප්‍රාසාදයක් කොට "ශර ප්‍රාසාද" නම් ශිල්පයක් ද, හීයෙන් මඩුවක් කොට "ශරමණ්ඩප" නම් ශිල්පයක් ද, හීයෙන් හිණක් කොට "ශරසොපාන" නම් ශිල්පයක් ද, හීයෙන් පවුරක් කොට "ශරප්‍රාකාර" නම් ශිල්පයක් ද, හීයෙන් පොකුණක් කොට "ශරපුෂ්කරිණි" නම් ශිල්පයක් ද, හීයෙන් පියුම් පිපීමට සළස්වා "ශරපදම" නම ශිල්පයක් ද, හී වර්ෂාවක් පවත්වා "ශරවර්ෂා" නම් ශිල්පයක් ද වශයෙන් ශිල්ප දොළසක් (12ක්) දැක්වූ බව ධර්මප්‍රදීපිකාව සඳහන් කරයි (ධර්ම ප්‍රදීපිකාව, 1951: 222-223 පි.).

කව්සිළුමිණ හෙවත් කුසදාවත (1994: 680 කවිය) හි දක්වන ආකාරයට,

"හෙත මහ කඩ පහරිනි ඔරයුග ගජරුවා
උදාගිරි හිස් අරුණා සිරි නොදවින් අරුණා"

යන්නෙහි අර්ථය ලෙස ඇතා පිට උන් හටයාගේ පාද දෙකම ඊතල පහරින් කැපී වැටෙන කල්හි ඔහු උයදගිරි පර්වත මුදුනෙහි වූ අරුණ දේවයාගේ හෝභාව නොඉසිලී ද වශයෙන් හඳුනාගත හැකිය. ඒ අනුව සතුරාගේ ශරීර අංග කැපී යන ආකාරයේ හී භාවිත කරමින් පහර දුන් බවද පැහැදිලි වේ.

එමෙන්ම හී විදීමේ දී තම තමන්ගේ හපන්කම් පිළිබඳ සදහන් කළ කඩපතක් හීයේ අමුණා සතුරා වෙත විදින ලද බව කව්සිළුමිණ ඇසුරින් හඳුනාගත හැකිය.

"දෙසෙන් සක් බැඳවූ කඬපතිනි ඔවුනොවුනට
සහදප් එඩි කළ පිළින තම හඟවා අසුන් දින්"

(කව්සිළුමිණ හෙවත් කුසදාවත, 1994: 663 කවිය)

යනුවෙන් සේනා දෙකෙහිම හටයන් ඊවල බැඳි පත් මගින් තම තමන්ගේ සාඩම්බර එඩිය ද අභියෝගයන් ද ඔවුනොවුනට දන්වා තමන් ද හඟවමින් අසුන් යැවූ බව දැක්වේ.

පළමුවන වන විමලධර්මසූරිය රජු ගිරි නම් තවුසා වාසය කළ මන්දාරම්පුර ජය ගැනීම සඳහා කඩු, දුනු පලිහ ඇඟෙහිලාගත් සෙනඟ ලවා මන්දාරම්පුරය වටකොට තිබේ (මන්දාරම්පුර පුවත, 1996: 109 පද්‍යය). දෙවන රාජසිංහ රජු පෘතුගීසින් සමඟ ගන්නෝරුව සටන සඳහා ගමන් කිරීමේදී කඩු, දුනු, තුවක්කු, පලිහ වැනි නොයෙක් අවි රැගෙන ගිය බව මන්දාරම්පුර පුවත සඳහන් කරයි (මන්දාරම්පුර පුවත, 1996: 324 පද්‍යය). උඩරට රාජධානි සමයේ සිංහලයන්ගේ යුධ බලය පිළිබඳ සඳහන් කරන රොබට් නොක්ස් යුධ භේවායන් ආහාර හා පැන් පිට උඩ තබාගෙන ද කඩු, හෙල්ල, දුනු හී අතින් දරාගෙන ද ගිය බව සඳහන් කරයි (එදා හෙළදිව, 1959: 181 පි.).

යුද්ධයන්හිදී දස්කම් දැක්වූ දුනුවායන්ට විවිධ ප්‍රදානයන් සිදු කිරීම පිළිබඳ මන්දාරම්පුර පුවතෙහි තොරතුරු ඉදිරිපත් වේ. පළමුවන විමලධර්මසූරිය රජු සමයේ සිදු කළ ප්‍රදානයන් පිළිබඳ මෙසේ සඳහන් වේ.

"රැදූ යුද පැමිණි ගරු මැතිඳුන් සිත් ලෙසි න
බජ්ජම් සමත් දුනුවා සදෙනට තොසි න
දිවිගල රත්නින්ද ඇයා කෙළි පත න
දියකඩ මඩිති ඉම්කර කුළුණින් දුන් න"

(මන්දාරම්පුර පුවත, 1996: 127 පද්‍යය)

තවද සෙනරත් රජු රන්දෙනිවෙල සටන ජයගත් පසු ද මේ ආකාරයෙන්ම ප්‍රදානයන් සිදු කර තිබේ (මන්දාරම්පුර පුවත, 1996: 252 පද්‍යය).

සාමාන්‍ය ජනයා හී වර්ෂා පැවැත්වීම් පිළිබඳ මහාවංසයේ තොරතුරු සඳහන් වේ. පළමුවන පරාක්‍රමබාහු කුමරා බුදු ගමට පැමිණ දින කීපයකට පසු


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

කුමාරයා අල්ලා ගැනීමේ අභිප්‍රායෙන් රට වැසියන් නිරතුරුව හී වැසි වැස් වූ බව සඳහන් වේ (මහාවංසය, 2018: පරි. 66, 26-27 ගාථා). උඩරට රාජධානි සමයේ සෙනරත් රජුගේ සේනාවන් රන්දෙනිවෙල සටනේ දී සතර දිගින් සතුරන් වට කොට හී වර්ෂා වැස්සවූ බව සඳහන් වේ (මන්දාරම්පුර පුවත, 1996: 237 පද්‍යය). මේ හැරෙන්නට සාමාන්‍ය වැසියන් දුනු ඊතල භාවිත කළ බවට තොරතුරු සද්ධර්මරත්නාවලියෙන් ද ඉදිරිපත් වේ. (සද්ධර්මරත්නාවලිය, 1961: 670, 673 පි.)

### 4.7. විෂ හී භාවිතය

දුනු භාවිතයේ දී ඇතැම් විට හීවලට විෂ පොවන ලද බව පෙනේ. ජාවක චන්ද්‍රභානුගේ භටයන් විෂ හී භාවිත කළ බවට මහාවංසයෙන් සාධක හමු වේ (මහාවංසය, 2018: පරි. 83, 44 ගාථාව). අභිධානප්පදීපිකාවෙහි විෂ පොවන ලද හී "දිඬො" (විසපීතො සරො) ලෙස නම්කර තිබේ (අභිධානප්පදීපිකා නම් පාලිනිඝණ්ඩුව, 1960: 379 පද්‍යය). දුන්නක් නගා විෂ පෙවූ හීයක් පත අවුළුවාගෙන විදීමට සූදානම් වීමක් පිළිබඳ සද්ධර්මරත්නාකරයේ සඳහන් වන අතර (සද්ධර්මරත්නාකරය, 1955: 58 පි.) විෂ පෙවූ හී පිළිබඳ සද්ධර්මරත්නාවලියේ ද දැක්වේ (සද්ධර්මරත්නාවලිය, 1961: 246 පි.). පළමුවන පරාක්‍රමබාහු රජු විසින් රාමඤ්ඤ දේශය ආක්‍රමණය කිරීම සඳහා යවන ලද යුද්ධ හමුදාවට විෂ පෙවූ හී වැදීමෙන් ඇති විය හැකි තුවාල සඳහා අවශ්‍ය ඖෂධ වර්ග යවා තිබේ (මහාවංසය, 2018: පරි. 76, 49-50 ගාථා). නමුත් මෙරට යුද්ධයන්හිදී විෂ හී භාවිත කිරීම පිළිබඳ සාධක හමු නොවේ. දක්ෂ දුනුවායන් සිංහල රජුට සිටිය ද කිසිම අවස්ථාවක විෂ යෙදූ හී සිංහලයන් විසින් භාවිත නොකළ බව විල්හෙල්ම් ගයිගර් ද පවසයි (ගයිගර්, 1969: 229 පි.). යුද්ධයන්හි දී විෂ පෙවන ලද හී භාවිත නොකරන ලද්දේ ලාංකිකයන්ට හී විෂ පෙවීමේ ක්‍රමය පිළබඳව දැනුමක් නොතිබීම නිසා නොව යුද්ධයන්හි ආචාර ධර්ම මැනවින් පිළිපැදීම නිසා බවත් යුද්ධයකින් ජයගත් තැනැත්තා එම ප්‍රදේශයේ පාලකයා වන බැවින් එම ප්‍රදේශයේ ජනතාවගේ ගැටලු විසඳීමට ද ඔහුට සිදුවන අතර ඒ නිසා විෂ හී වැදීම නිසා තුවාල වුවන් සුව කිරීමේ කාර්යය පාලකයාට භාර වන බවත් තවද ලාංකික පාලකයන් බොහෝ දුරට උත්සාහ කර ඇත්තේ මිනිස් ඝාතනයක් කිරීමට වඩා හැකි තරම් ජීවග්‍රාහයෙන් අල්ලා ගනිමින් යන්ත්‍ර සූත්‍ර හිඟ කාලයක මිනිස් ශ්‍රමය යොදා ගැනීමට කටයුතු කිරීම බවත් ඒනිසා විෂ හී භාවිතයෙන් වළකින්නට ඇති බවත් ටී. ජී. කුලතුංග පෙන්වා දෙයි (කුලතුංග, 1988: 151 - 153 පි.). මේ සඳහා බෞද්ධාගමික පසුබිම ද බලපෑම් කරන්නට ඇති බව පැහැදිලිය.

### 4.8. වෙනත් අවස්ථාවලදී භාවිතය

සිංහල බෝධිවංසයේ දැක්වෙන ආකාරයට ශ්‍රී මහා බෝධීන් වහන්සේ සමඟ පැමිණි විවිධ පුද්ගලයන්ට විවිධ තනතුරු ප්‍රදානය කළ අතර දුනුවාකුලෙහි ප්‍රධාන තැනැත්තන්ට තමා පිරිවර දුනුවායන් ගෙන ශ්‍රී මහා බෝධියට කපුටු ආදීන්ට බැසීමට ඉඩ නොදී ආරක්ෂා කළවුන්ට මහ බෝ රකිනා තනතුරු ලබා දී තිබේ (සිංහල බෝධිවංසය, 1929: 213-214 පි.). වෛජයන්ත තන්ත්‍රයේ රජෙකු අභිෂේක වීමෙන් අනතුරුව සිදුකළ යුතු නගර ප්‍රදක්ෂිණා විධි යටතේ සයවන මණ්ඩලයේ ගමන්කළ යුතු ආකාරය දැක්වෙන විස්තරවල දී ධවල වස්ත්‍රයෙන් නානාලංකාරයෙන් සැරසුන පුරුෂයන් ගෙන යායුතු දේවල් දක්වා තිබෙන අතර එහි දී දුනු, කඩු, පොලු, මුගුරු හෙංඩිවාල, අත්සිරිය ආදී පංචායුධ රැගෙන යායුතු බව දක්වයි (වෛජයන්ත තන්ත්‍රය, 1983: 359 පි.). මෙයින් පසුකාලීන අභිෂේක කටයුතුවල පෙරහැරේ රැගෙන යාමට දුන්න ද අවශ්‍ය අවස්ථාවක් වන්නට ඇති බව නොඅනුමානය.

ටී.ජී. කුලතුංග පවසන ආකාරයට දුනු මගින් සතුරන් වෙත ගල් විසි කළ බවට අනුමාන කළ හැකි පුරාවිද්‍යාත්මක සාධක පොළොන්නරුවෙන් හමු වී තිබේ. සංස්කෘතික ත්‍රිකෝණය මඟින් පොළොන්නරු ඇතුළු නුවර වටා වූ ප්‍රාකාරය කැනීමේ දී එහි ස්ථාන කීපයකම මීටරයක පමණ විෂ්කම්භයකින් යුක්ත කුඩා ළිං හා සමාන වලවල් ප්‍රාකාර බැම්ම තුළ තිබී හමු වී ඇත. මේවා තුළ විදීමට යොදා ගන්නා ලද ගල් බෝල රාශියක් ද හමු වී තිබේ (කුලතුංග, 1988: 156 - 157 පි.).

## 5. සමාලෝචනය

පුරාතන ශ්‍රී ලාංකිකයන් පිළිබඳ අවධානය යොමු කරන විට යුධමය කටයුතු හා වෙනත් කටයුතු සම්බන්ධ අවස්ථාවන්හි දී භාවිතයට ගත් අවි ආයුධ ගණනාවක් පිළිබඳ සාහිත්‍යමය මෙන්ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

ඔස්සේ තොරතුරු අනාවරණය වේ. සාහිත්‍යමය මූලාශ්‍රය ඔස්සේ විමසන විට ආයුධ භාවිත කිරීමේ විවිධ අවස්ථාවන් මෙන්ම ආයුධ නිර්මාණ ශිල්පයන් පිළිබඳව ද තොරතුරු රාශියක් අනාවරණය වේ. මෙලෙස තොරතුරු ඉදිරිපත් වන ආයුධ අතර පංචායුධ ප්‍රමුඛ අවස්ථාවක් වන අතර විශේෂයෙන්ම යුධමය කටයුතුවල දී භාවිතයට ගන්නා ලද දුන්න මූලික අවස්ථාවක් බව හඳුනාගත හැකිය. පුරාතන ශ්‍රී ලංකාවේ ඉතිහාසකරණ සම්ප්‍රදාය නියෝජනය කරන සාහිත්‍යමය මූලාශ්‍රය ඔස්සේ විමසන විට දුන්න සඳහා "ඉස්සාසං", "ධනු", " කොදණ්ඩං", " චාපො", " සරාසනං" වැනි නාමයන් භාවිතා වූ අතර දුනුදිය "ගුණෝ", "ජියා", "ජ්‍යා" ලෙස හඳුන්වා තිබෙන බව දක්නට ලැබේ. හීය සඳහා " සරො", "පත්ති", "සායකො", "බාණො", "කණ්ඩ", " මුසු", "බුරප්පො", "තෙජනා", "සනං", "කඬ" වැනි නාමයන් භාවිතා කර තිබේ. ඊතල සාදන වඩුවා "හී වඩු" ලෙස හඳුන්වන ලද අතර හී උරය "තූණි", " කලාපො", "තූණො", "තූණීර", "බාණධි", "ඉයොර" වශයෙන් හඳුන්වා තිබේ. දුනු භාවිත කරන්නා " ධනුග්ගහ", "ධනුර්ධර", "දුනුවාවන්", "දුනුවාබලත්" වැනි නාමයන්ගෙන් ද දුනු පිළිබඳ ශිල්පය "ධනු ශිල්ප" වශයෙන් ද දුනු ශිල්පය ඉගැන්වූවන් "ධනු අචරිය" යනුවෙන් ද දුන්නෙන් විදින ඉලක්කය "ලක්ඛං", " වේජ්ඣං", "සරව්‍යං" වශයෙන් ද හඳුන්වා තිබේ. දුන්නෙහි හැඩය, නිර්මාණය කරන ලද ද්‍රව්‍ය, භාවිත කරන ආකාරය වැනි අවස්ථා මත පදනම්ව දුනු වර්ග ගණනාවක් හඳුනාගත හැකි අතර දඹදෙණි අස්නෙහි දුනු වර්ග 21 ක් පිළිබඳ සඳහන් දක්නට හැකිය. දුනු නිර්මාණ ශිල්පය විමසන විට විවිධ අමුද්‍රව්‍ය යොදාගෙන භාවිතා කරන්නාගේ ශක්ති ප්‍රමාණය හා අවශ්‍යතාවය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් එය සිදු කර තිබෙනු දැකිය හැකිය. දුනු භාවිතයේ විවිධ අවස්ථා පිළිබඳ තොරතුරු ඉදිරිපත් වන අතර යුධමය කටයුතු හා සම්බන්ධව විමසන විට බොහෝ අවස්ථාවන්හි දී රාජකීයයන්, රණශූරයන් මෙන්ම සාමාන්‍ය පුද්ගලයන් දුන්න භාවිතයට ගත් බවද දුනු ශිල්පයෙහි පරතෙර පැමිණියවුන් සිටි බවද දක්නට ලැබේ. දුනු ශිල්පයේ දක්ෂතා දැක්වීම් පිළිබඳ ඇතැම් විට අතිශයෝක්තිමය තොරතුරු ද ඉදිරිපත් වුවද එකී තොරතුරු ඇසුරින් දුනු ශිල්පයේ වර්ධනාත්මක ප්‍රවේශය හඳුනාගත හැකිය. ඇතැම් අවස්ථාවලදී දුනු ශිල්පයේ දක්ෂතා දැක්වූවන්ට රාජකීය දීමනාවන් පවා සිදු වී තිබේ. ඇතැම් අවස්ථාවලදී විෂ හී භාවිතා කිරීම පිළිබඳ තොරතුරු ඉදිරිපත් වුවද මෙරට වැසියන් එයට ප්‍රිය නොකළ බවක් ඉස්මතු වේ. ආගමික හා සංස්කෘතික කටයුතුවලදී ද දෙවියන්ගේ දේවාභරණ අතර වැදගත් ආයුධයක් ලෙස දුන්න සැළකූ බවද දක්නට හැකිය. තවද රාජාභිෂේකය හා සම්බන්ධ ඇතැම් කටයුතුවල දී ද දුන්න භාවිතයට ගැනීම පිළිබඳව තොරතුරු ඉදිරිපත් වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි නාමාවලිය


- **අභිධානප්පදීපිකා නම් පාලිනිඝණ්ඩුව.** (1960). සංස්. මොරගොල්ලේ සිරි ඤාණොභාතිස්ස හිමි. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
- **අලකේශ්වර යුද්ධය.** (1965). සංස්. ඒ. වී. සුරවීර. කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.
- ආනන්ද හිමි, කෝන්ගස්තැන්නේ. (1997). **දඹදෙණි අස්න සහ කඳවුරු සිරිත.** මාතර: සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.
- ආරියපාල, ඇම්. බී. (1962). **මධ්‍ය කාලීන ලංකා සමාජය.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- ඉලංගසිංහ, මංගල. (2002). **පෙරදිග දේශපාලන චින්තනය.** මහනුවර: ආර්ය පොත්හල (පුද්) සමාගම.
- **ඌනපූරණසහිතො මහාවංසො.** (1959). සංස්. ඒ. පී. බුද්ධදත්ත හිමි. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
- **එදා හෙළදිව.** (1959). රොබට් නොක්ස්, අනු. ඩේවිඩ් කරුණාරත්න. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
- එල්ලාවල, එච්. (1962). **පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය.** කොළඹ: සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව.
- **කව්සිළුමිණ හෙවත් කුසදාවත (පැරණි සන්නය සහිතයි).** (1994). සංස්. ඇම්. බී. ආරියපාල. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- කුලතුංග, ටී. ජී. (1988). **මධ්‍යකාලීන ශ්‍රී ලංකාවේ ආරක්ෂක සංවිධාන (ක්‍රි. ව. 10 සිට 12 වැනි සියවස අවසන දක්වා).** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- **කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රය අධිකාර 3-4-5-6-7.** (2003). අනු. හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- ගමගේ, ජී. ඇස්. (1997). **මහනුවර යුගයේ රාජ්‍ය ආරක්ෂක ක්‍රමෝපාය.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.



*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka.* jahs@ssh.rjt.ac.lk

- ගයිගර්, විල්හෙල්ම්, (1969). **මධ්‍ය කාලීන ලංකා සංස්කෘතිය**, පරි. ඇම්. බී. ආරියපාල, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
- **ජාතක අටුවා ගැටපදය.** (1961). සංස්. මැදඋයන්ගොඩ විමලකීර්ති හිමි සහ නැහින්නේ සොමින්ද හිමි. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
- **දඹදෙණි අස්න.** (1928). සංස්. ඩී. ඩී. රණසිංහ. කොළඹ: ග්‍රන්ථ ප්‍රකාශන ශාස්ත්‍රාලය.
- දැරණියගල. පී. ඒ. පී. (1956). **සිංහල ත්‍රාසජනක ක්‍රීඩා.** අනු. හේ. මු. අභයරත්න. කොළඹ: ලංකා ජාතික කෞතුකාගාර ආයතනය.
- **දීපවංශය.** (1990). සංස්. කිරිඇල්ලේ ඥාණවිමල හිමි. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
- **පාළි බෝධිවංස ගැටපදය.** (1957). සංස්. රත්මලානේ ධර්මකීර්ති හිමි. ලංකා බෞද්ධ මණ්ඩලය.
- **පූජාවලිය.** (1951). සංස්. කිරිඇල්ලේ ඥාණවිමල හිමි. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
- **මෞද්ගල්‍යායන පඤ්චිකා ප්‍රදීපය.** (1896). සංස්. රත්මලානේ ශ්‍රී ධර්මාරාම හිමි. කොළඹ: රාජකීය මුද්‍රයන්ත්‍රාලය.
- **මන්දාරම්පුර පුවත.** (1996). සංස්. ලබුගම ලංකානන්ද හිමි. කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්මේන්තුව.
- **මහාවංසය.** (2018). සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ පඬිතුමන්. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **රසවාහිනී.** (1961). සංස්. කිරිඇල්ලේ ඥාණවිමල හිමි. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
- **රාජාවලිය.** (1926). සංස්. බී. ගුණසේකර මුදලිමන්ත්‍රී. කොළඹ: රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
- **වංසත්ථප්පකාසිනී මහාවංසටීකාව - සිංහල අනුවාදය.** (1994). අනු. අකුරැටියේ අමරවංස නාහිමි සහ හේමචන්ද්‍ර දිසානායක. කැළණිය විශ්වවිද්‍යාලය: පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.
- විමලානන්ද, තෙන්නකෝන්. (1962). **උඩරට මහ කැරැල්ල දෙවැනි කාණ්ඩය.** කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
- **වෛජයන්ත තන්ත්‍රය සංස්කෘත පෙළ සහ සිංහල භාවසන්න සහිතයි.** (1983). සංස්. නන්දසේන මුදියන්සේ. කැළණිය: කැළණිය විශ්වවිද්‍යාලය.
- **ශ්‍රී ලංකා බිතු සිතුවම් දඹුල්ල.** (1990). සංස්. නන්දන චූටිවොංග්ස්, ලීලානන්ද ප්‍රේමතිලක, රෝලන්ඩ් සිල්වා. ශ්‍රී ලංකා පුරාවිද්‍යා අධිකාරිය ශත සාංවත්සරික ප්‍රකාශන. කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.
- **සද්ධර්මරත්නාවලිය.** (1961). සංස්. කිරිඇල්ලේ ඥාණවිමල හිමි. කොළඹ: ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාලය.
- **සිතියම් සහිත සද්ධර්මාලංකාරය.** (1953). සංස්. කළුතර සාරානන්ද හිමි. කොළඹ: රත්නාකර පොත් වෙළඳ ශාලාව.
- Deraniyagala, P.E.P. (1942). "Sinhala Weapons and Armor". **Journal of the Ceylon Branch of the Royal Asiatic Society of Great Britain & Ireland, Vol. 35, No 95**. Colombo: Royal Asiatic Society of Sri Lanka.
- Paranavithana, S. (1970). **Inscription of Ceylon, Vol. I.** Colombo: Department of Archealogy.
- Paranavithana, S. (1983). **Inscription of Ceylon, Vol. II, pt. I.** Colombo: Department of Archealogy.
- Wickremasinghe, D. M. de. Z. (1928). **Epigraphia Zeylanica, Vol. II**. London: Oxford University Press.



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk